# ප්‍රවාහන අමාත්‍යාංශය
# போக்குவரத்து அமைச்சு
# Ministry of Transport



ගරු ප්‍රවාහන අමාත්‍යතුමා

கௌரவ போக்குவரத்து அமைச்சர்

Hon. Minister of Transport



ගරු ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමා

கௌரவ போக்குவரத்து பிரதி அமைச்சர்

Hon Deputy Minister of Transport



ප්‍රවාහන අමාත්‍යාංශ ලේකම්තුමා

போக்குவரத்து அமைச்சின் செயலாளர்

Secretary to the Ministry of Transport

ප්‍රවාහන අමාත්‍යාංශය

# 2013 වසර කාර්ය සාධන වාර්තාව


අංක 01

ඩී.ආර්. විජේවර්ධන මාවත

කොළඹ 10



2014, මාර්තු

## දැක්ම

අප කලාපයේ වඩාත්ම සුව පහසුවෙන්

යුත් දුම්රිය හා බස් සේවාවක් ඇති රට

ශ්‍රී ලංකාව

බවට පත් කිරීම අපගේ ඒකායන අරමුණයි.

## මෙහෙවර

මහින්ද චින්තනානුකූලව වඩාත් සුව පහසුව සපිරි

ශ්‍රී ලාංකික ජන ජීවිතයක් වෙනුවෙන්

එදිනෙදා ප්‍රවාහන කටයුතු

වඩාත් ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා

සියලු මානව සම්පත් හා යටිතල පහසුකම්

නූතන තාක්ෂණය උපයෝගී කරගනිමින්

නිරන්තරව දියුණු කිරීම

හා පවත්වාගෙන යාම අපගේ මෙහෙවරයි.

# පටුන

## I කොටස

**1. හැඳින්වීම ....................................................................................................1**

**2. ආයතන අංශය විසින් ඉටුකරන ලද කාර්යභාරය .............................................................1**

2.1. 2013 වර්ෂය තුලදී ඉඩම් අංශය විසින් ඉටුකරන ලද කාර්යයන් ....................................1

2.1.1 අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සහ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම..........................................1

2.1.2 ඉඩම් අංශය විසින් ඉටුකර ඇති අනිකුත් කාර්යයන් ...........................................1

2.2 2013 වර්ෂය තුලදී දුම්රිය පාලන අංශය විසින් ඉටු කරන ලද කාර්යයන් .......................2

2.3 නීති අංශය විසින් ඉටුකරන ලද කාර්යයන් .....................................................................3

2.4 මානව සම්පත් සංවර්ධනය සඳහා ආයතන අංශය විසින් ඉටු කරන ලද කාර්යයන්........4

2.5 ආයතන අංශය විසින් ඉටු කරන ලද වෙනත් කාර්යයන්................................................4

**3. මුල්‍ය කළමනාකරණය හා ප්‍රගතිය.............................................................................7**

3.1 ප්‍රසම්පාදන කමිටු ........................................................................................................7

3.2 මුල්‍ය කළමනාකරණය ..................................................................................................7

**4. 2013 වර්ෂය තුලදි සැලසුම් අංශය විසින් ඉටු කරන ලද කාර්යයන්.............................12**

**5. 2013 වර්ෂයේදී අභ්‍යන්තර විගණන අංශය විසින් ඉටුකරන ලද විමර්ශන රාජකාරී පිළිබඳ විස්තර සාරාංශය.............................................................................................14**

**6. නව දුම්රිය මාර්ග සංවර්ධන අංශය ........................................................................15**

6.1 මාතර - කතරගම නව දුම්රිය මාර්ගය ........................................................................ 15

6.2 කැළණිවැලි දුම්රිය මාර්ගය අවිස්සාවේල්ල සිට හම්බන්තොට දක්වා දීර්ඝ කිරීම ....................................................................................................................... 17

6.3 කුරුණෑගල - හබරණ නව දුම්රිය මාර්ගය.................................................................. 17

6.4 හොරණ - කොට්ටාව නව දුම්රිය මාර්ගය................................................................... 17

6.5 මැදවච්චිය - ත්‍රිකුණාමලය නව දුම්රිය මාර්ගය ........................................................ 18

6.6 වැල්ලවාය - බදුල්ල නව දුම්රිය මාර්ගය..................................................................... 18

6.7 ත්‍රිකුණාමලය - පුත්තලම නව දුම්රිය මාර්ගය ........................................................... 18

**7. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව ..........................................................................18**

7.1 හඳුනා නොගත් වාහන වලින් අනතුරට පත් පුද්ගලයන් සඳහා වන්දි යෝජනා ක්‍රීමය.. 19

7.2 මාර්ග ආරක්ෂාවට අදාල වැඩසටහන් ...................................................................... 19

7.3 මාර්ග ආරක්ෂණ කොමිසම පිහිටුවීම සඳහා නීති සම්පාදනය. .................................... 19

## II කොටස


**1. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව ........ 23**

1.1 හැඳින්වීම ........ 23

1.2 මෙහෙයුම් දර්ශක ........ 25

1.3 යටිතල පහසුකම් සංවර්ධනය ........ 25

1.3.1 දුම්රිය මාර්ග ........ 25

1.3.2 සංඥා හා විදුලි සංදේශ පද්ධතිය ........ 26

1.3.3 දුම්රිය ඇණිය ........ 26

1.4 මූල්‍ය ප්‍රගතිය ........ 26

**2. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ........ 27**

2.1 පසුබිම ........ 27

2.2 මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කාර්යයන් ........ 27

2.3 කාර්ය සාධනය (2013 ජනවාරි - දෙසැම්බර් 31) ........ 27

**3. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය ........ 31**

3.1 සමාජ ප්‍රතිලාභ සඳහා ශ්‍රී ලංගම දායකත්වය ........ 31

3.2 බස් රථ ධාවනය තුලින් ලබා ගෙන ඇති ප්‍රගතිය ........ 32

3.3 ශ්‍රී ලංගම බස්රථ ඇණිය ........ 34

3.4 ශ්‍රී ලංගම මානව සම්පත ........ 36

3.5 ශ්‍රී ලංගම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම ........ 37

**4. ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය ........ 39**

4.1 හැඳින්වීම ........ 39

4.2 පරමාර්ථ ........ 39

4.3 ආයතනයේ කාර්යයන් ........ 39

4.4 වර්තමාන කාර්ය සාධනය ........ 40

4.5 ආයතනයේ ආදායම් වියදම් තත්ත්වය. ........ 44

**5. සීමාසහිත ලක්දිව ඉංජිනේරු පුද්ගලික සමාගම ........ 45**

5.1 හැඳින්වීම ........ 45

5.2 2013 වර්ෂයේ ආයතනය ලබා ඇති ප්‍රගතිය (භෞතික හා මූල්‍ය) ........ 45

5.3 යටිතල පහසුකම් ........ 45

5.4 ඵලදායීතා වැඩ සටහන් ........ 45

# I කොටස

## අමාත්‍යාංශයේ කාර්ය සාධනය

## 1. හැඳින්වීම

රටක ආර්ථික හා සමාජ සංවර්ධනය උදෙසා කාර්යක්ෂම හා ආරක්ෂාකාරී ප්‍රවාහන සේවාව අත්‍යාවශ්‍ය සාධකයක් වන බැවින් ප්‍රවාහන අමාත්‍යාංශය වෙත පැවරී ඇත්තේ ඉතා භාරදූර කාර්යභාරයකි. රටෙහි සිදුවන සීඝ්‍ර ආර්ථික හා සමාජ සංවර්ධනයත් සමඟ ප්‍රවාහන ක්ෂේත්‍රයේ සිදුවිය යුතු කාලානුරූපී වෙනස්කම් සිදුකරමින් අමාත්‍යාංශය යටතේ පවතින ආයතන මෙහෙයවනු ලැබීම උදෙසා ප්‍රවාහන අමාත්‍යාංශ කාර්යාලය 2013 වර්ෂය තුලදී ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳව තොරතුරු මෙම වාර්තාවෙන් ඉදිරිපත් කෙරේ. ඒ අනුව අමාත්‍යාංශය වෙත පැවරී ඇති කර්තව්‍යයන් වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අයවැය ප්‍රතිපාදන මනා කළමනාකාරීත්වයක් සහිතව භෞතික හා මානව සංවර්ධනය සඳහා ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ හා එකී තීරණ ක්‍රියාත්මක කිරීමේදී අමාත්‍යාංශ කාර්යාලයේ එක් එක් අංශය මඟින් 2013 වර්ෂයේ ඉටු කරනලද කාර්යයන් පිළිබඳව විස්තර මෙහි ඇතුලත් කර ඇත.

මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ආදී සියළුම ආයතන මඟින් වාර්ෂික කාර්ය සාධන වාර්තා විස්තරාත්මකව සකස් කරනු ලබයි. එසේ වුවද සමස්ථ වශයෙන් ප්‍රවාහන අමාත්‍යාංශයේ කාර්ය සාධනය විදහා දැක්වීම උදෙසා එකී ආයතන විසින් ඉටුකරන ලද කාර්යයන් පිළිබඳ සාරාංශගත සටහනක්ද මෙහිම ඇතුලත් කර ඇත.

## 2. ආයතන අංශය විසින් ඉටුකරන ලද කාර්යභාරය

### 2.1. 2013 වර්ෂය තුලදී ඉඩම් අංශය විසින් ඉටුකරන ලද කාර්යයන්

#### 2.1.1 අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සහ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම

| ආයතනය | විස්තරය |
|---|---|
| දුම්රිය දෙපාර්තමේන්තුව | මාතලේ දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් බඩු ගබඩාව පොදු වෙළඳපළක් ඉදිකිරීම සඳහා මාතලේ මහ නගර සභාවට බදු පදනම මත පවරා දීම. |
| රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය | ඔරුගොඩවත්ත දැව සංස්ථා පර්යන්තය පුනස්ථාපනය සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව සතු රත්මලාන වැඩ බිමෙන් බිම් කොටසක් ලබා දීම. |
| රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස් ඩිපෝව පුනස්ථාපනය කිරීම හා මධ්‍යම බස් නැවතුම්පොළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය. |
| රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය | කොළඹ නගරයේ නාගරික සංවර්ධන ව්‍යාපෘති සඳහා රජයේ ඉඩම් පවරා ගැනීම. |

#### 2.1.2 ඉඩම් අංශය විසින් ඉටුකර ඇති අනිකුත් කාර්යයන්

1. 2013 ජනවාරි 01 සිට 2013 දෙසැම්බර් 31 දක්වා වූ කාලය තුලදී ඉඩම් පිළිබඳ කටයුතු වලට අදාලව ලිපි 400 ක් පමණ ලැබී ඇති අතර එම සියළුම ලිපි සඳහා අදාල පරිදි කටයුතු සිදුකොට ඇති අතර එහිදී පහත කරුණු සම්බන්ධයෙන් අදාල පාර්ශවයන් සමඟ සාකච්ඡා කොට විසඳුම් ලබා ගැනීමට කටයුතු කර ඇත.

- දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් අනුරාධපුර පිහිටි දුම්රිය ක්‍රීඩාංගනය අනුරාධපුර මධ්‍යී මහා විද්‍යාලයට පවරා ගැනීම

  2013/05/31 දින සිදුකළ ස්ථාන පරීක්ෂාව අනුව ක්‍රීඩාංගනයෙන් කොටසක් පවරා දීමට එකඟව ඒ අනුව කටයුතු කිරීමට අදාල අංශ වෙත උපදෙස් ලබා දී ඇත.

- බදු ගිවිසුම් එල්.ඒ 35906 ශ්‍රී ලංගම දුම්රිය දෙපාර්තමේන්තුව සහ උපාලි පුවත්පත් සමාගම ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක 125/19.

  උපාලි පුවත්පත් ආයතනයට ගෙවීම් කළ හැකි ආකාරය පිළිබඳ වාර්තා කිරීමට දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරිගේ ප්‍රධානත්වයෙන් ත්‍රිපුද්ගල කමිටුවක් 2013.05.10 දී පත් කිරීම.

- යුධ හමුදාවේ යන්ත්‍රෝපකරණ බලකායේ තොග ගබඩාව ස්ථානගත කිරීම සඳහා රාගම දුම්රිය අංගනය පිහිටි ඉඩම/ ගොඩනැගිලි පවරා ගැනීම (2013.04.09).

  ස්ථාන පරීක්ෂාවකින් පසු ලබා දිය හැකි බිම් ප්‍රමාණය ලබා දීමට කටයුතු කර ඇත.

- නාරම්මල බස් නැවතුම්පොළ පිහිටි භූමිය ප්‍රාදේශීය සභාව වෙත පවරා දීම (2013.08.06). එකඟ වූ පරිදි නාරම්මල ප්‍රාදේශීය සභාවෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත ඉටු විය යුතු කාර්ය ඉටු වීමෙන් අනතුරුව ඉඩම නීත්‍යානුකූලව පවරා දීමට එකඟ විය. එහෙත් කටයුතු කරගෙන යාමට අවසර ලබා දීම.

- දුම්රිය නිවාස කුලී විෂමතා (2013.10.10)

  දුම්රිය කුලී නිවාස වල පවතින අඩුපාඩු සාකච්ඡා කර 2013/05/28 දුම්රිය සාමාන්‍යාධිකාරී සමඟ පැවති සාකච්ඡාවේ තීරණ කඩිනමින් ක්‍රියාත්මක කිරීමට තීරණය විය.

2. ඕපනායක පොලිස් ස්ථානය පවත්වාගෙන යනු ලබන දුම්රිය රක්ෂිත ඉඩම පොලිස් දෙපාර්තමේන්තුවට පවරා දීමට කටයුතු කිරීම.

3. ඕමන්ත පලෙයි දුම්රිය මාර්ගය නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතියට අවශ්‍ය වන අතිරේක ඉඩම් ප්‍රමාණයන් අත්කර ගැනීම සඳහා 38 (ආ) අතුරු විධිවිධාන යටතේ කඩිනමින් පවරා ගැනීමට කටයුතු කර ඇත.

4. "දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම්වල අනවසරයෙන් පදිංචි වී ඇති දුම්රිය දෙපාර්තමේන්තු සේවකයන් හා අනවසරකරුවන් පිළිබඳව පොදු ප්‍රතිපත්තියක් සකස් කිරීම." යන මැයින් පත්කර ඇති ඉඩම් අනු කාරක සභාව රැස් කිරීමට කටයුතු සිදු කරමින් පවතී.

## 2.2 2013 වර්ෂය තුලදී දුම්රිය පාලන අංශය විසින් ඉටු කරන ලද කාර්යයන්

- දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් සියලුම මාණ්ඩලික තනතුරු හා සේවාවන්ට අයත් පත් කිරීමේ සිට විශ්‍රාම යාම දක්වා වූ මාරු කිරීම්, උසස් කිරීම්, විනය රාජකාරී ද, කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට අදාල රාජකාරී කටයුතු කිරීම හා නැවත සේවයේ පිහිටුවීමට අදාල රාජකාරී කටයුතු අමාත්‍යාංශය මඟින් හා අදාල වෙනත් ආයතන හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් ඉටු කිරීම.

- විදේශ නිවාඩු, හදිසි අනතුරු නිවාඩු, හදිසි අනතුරු වන්දි පිළිබඳ රාජකාරී ඉටු කිරීම.

- වෘත්තීය සමිති කටයුතු සඳහා සේවයෙන් නිදහස් කිරීම, වෘත්තීය සමිති ඉල්ලීම් හා වෙනත් පැමිණිලි සම්බන්ධ කටයුතු කිරීම.

- දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් රේල්පීලි, සිල්පර කොට, ඇතුළු අබලි ද්‍රව්‍යය. නිකුත් කිරීම සඳහා කමිටුවක් පත්කර ඇත. එම කමිටු නිර්දේශය මත අදාල කටයුතු සිදු කිරීම.

- දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවයට පැමිණෙන විදේශිකයන් සඳහා වීසා බලපත්‍ර ලබා දීමේ කටයුතු සිදු කිරීම.

- දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්තව සිට දේශපාලන පලිගැනීම් වලට හා ජූලි වැඩවර්ජනයට ලක් වුවන්ට සහන සැලසීමට අදාල රාජකාරී ඉටු කිරීම.

- දුම්රිය දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලය සංශෝධනය කරන ලද අතර සංශෝධිත නව කාර්යය මණ්ඩලය හා රා.ප.ච. 6/2006 අනුව ඒ ඒ තනතුරු සඳහා වූ වැටුප් පරිමාණ 2013. 04. 09 දින කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කර ඇත. ඒ අනුව සේවක සංඛ්‍යාවේ හා වැටුප් පරිමාණ තව දුරටත් සංශෝධනය වෙමින් පවතී.

- පහත සදහන් තනතුරු සඳහා රා.ප.ච. 6/2006 අනුව මේ වන විටත් නව බඳවා ගැනීමේ පරිපාටි සකස් කර අනුමත කරවාගෙන ඇති අතර, එම පරිපාටිද සංශෝධනය වෙමින් පවතී.

  - දුම්රිය ස්ථානාධිපති සේවය.
  - දුම්රිය අධීක්ෂණ කළමනාකරණ සේවය.
  - දුම්රිය රියදුරු තනතුර.
  - දුම්රිය නියාමක සේවය.
  - රියදුරු ෂන්ටින් / රියදුරු සහායක.

- අනෙකුත් තනතුරු වලට අදාලව රා.ප.ච. 6/2006 අනුව නව බඳවා ගැනීමේ පරිපාටි, වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් ලේකම්ගේ හා ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ ද නිර්දේශ සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී.

- ත්‍රිවිධ හමුදා සේවයෙන් ඉවත්ව දුම්රිය ආරක්ෂක සේවයට බඳවාගනු ලැබූ නිළධාරීන් 115 දෙනාගෙන් මේ වන විට සේවයේ යෙදී සිටින විශ්‍රාමික නිළධාරීන් 13 දෙනාගේ සේවා කාලය කොන්ත්‍රාත් පදනම මත තබා ගැනීමට හා අනෙකුත් නිළධාරීන් 102 දෙනකු දුම්රිය ආරක්ෂක සේවයට ස්ථිරව බඳවා ගන්නා ලදී.

- දීර්ඝ කාලයක් දුම්රිය දෙපාර්තමේන්තමේන්තුවේ සේවය කල, අවුරුදු 45 ඉක්මවීම හේතුවෙන් ස්ථිර සේවයට පත්වීමට අවස්ථාවක් නොලැබූ උණ බම්බු ගේට්ටුකරුවන් 325 දෙනකු සේවයේ ස්ථිර කිරීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කළ අතර ඒ සඳහා ඔවුන් අවුරුදු 60 සම්පූර්ණ වී විශ්‍රාම යන දිනයට සේවාකාලය හා අවසන් වරට ලැබූ වැටුප් පදනම් කර ගනිමින් දීමනාවක් ගෙවීමට තීරණය විය.

**2.3 නීති අංශය විසින් ඉටුකරන ලද කාර්යයන්**

2013 වසරේ නීති කටයුතු සම්බන්ධ කාර්යය සාධනය

| | | |
|---|---|---|
| 2013 වසරේ කටයුතු කරනු ලැබූ නව නඩු සංඛ්‍යාව | - | 12 |
| මානව හිමිකම් පැමිණිලි සංඛ්‍යාව | - | 04 |
| අලුතින් පනවා ප්‍රකාශයට පත් කරන ලද නව රෙගුලාසි සංඛ්‍යාව | - | 06 |

### 2.4 මානව සම්පත් සංවර්ධනය සඳහා ආයතන අංශය විසින් ඉටු කරන ලද කාර්යයන්

| | පුහුණු වැඩසටහන් ගණන | සහභාගීවූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| **විදේශීය** | **54** | **189** |
| ප්‍රවාහන අමාත්‍යාං ශය | 17 | 24 |
| දු.දෙපා. | 25 | 135 |
| මෝ.ප්‍ර.දෙපා. | 10 | 28 |
| ශ්‍රී.ලංගම හා මා.ආ.පි.ජා.ස. | 2 | 2 |
| | | |
| **දේශීය** | **41** | **70** |

### 2.5 ආයතන අංශය විසින් ඉටු කරන ලද වෙනත් කාර්යයන්

අභ්‍යන්තර පාලන අංශය විසින් ඉටු කරනු ලබන කාර්යයන් පිළිබද තොරතුරු පහත පරිදි වේ.

| වැඩසටහන | ක්‍රියාකාරකම් |
|---|---|
| 1. තැපෑල | i. ලැබෙන හා යවන ලිපි භාර ගැනීම.<br>ii. දෛනික තැපෑල බෙදාහැරීම.<br>iii. මුද්දර යන්ත්‍රය නඩත්තු කිරීම හා ඒ සම්බන්ධ ගෙවීම් කටයුතු සිදු කිරීම. |
| 2. පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම.<br>■ මාණ්ඩලික නිලධාරීන්<br>■ භාෂා පරිවර්ථක සේවය<br>■ තාක්ෂණ සේවය<br>■ සැලසුම් ශිල්පීන්<br>■ රියදුරන්<br>■ උපාධිධාරී සේවය<br>■ රා.කල.ස සේවයේ<br>■ කා.සේ.සේ. සේවයේ<br>■ කාර්මික නිලධාරීන්<br>■ අනියම් කම්කරුවන් | i. වාර්ෂික කාර්ය සාධන වාර්තා ලබා ගැනීම, අනුමත කිරීම.<br>ii. වැටුප් වර්ධක ලබා දීමේ කටයුතු<br>iii. උසස්වීම් ලබා දීම/ පත්කිරීම කටයුතු (රාජකාරී ආවරණ හා වැඩබැලීම)<br>iv. විශ්‍රාම ගැන්වීම.<br>v. ස්ථාන මාරුවීම් සම්බන්ධ කටයුතු<br>vi. විදේශ නිවාඩු සම්බන්ධ කටයුතු<br>vii. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා නිලධාරීන් සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සකස් කිරීම, අනුමැතියට ඉදිරිපත් කිරීම.<br>viii. මු.රේ 71 සකස් කිරීම. (තනතුරු ඇති කිරීම)<br>ix. අන්තර්ග්‍රහණය කිරීම.<br>x. වැටුප් පරිවර්තන කටයුතු සිදු කිරීම.<br>xi. කඩඉම් පරීක්ෂණ සඳහා අයදුම් පත්‍ර යැවීම.<br>xii. සේවා සහතික ලබා දීම.<br>xiii. විභාග සඳහා අයදුම්පත් නිර්දේශ කර ඉදිරිපත් කිරීම. |
| 3. ගරු අමාත්‍ය තුමාගේ හා ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ කාර්ය මණ්ඩලය සම්බන්ධ කටයුතු | i. ගරු අමාත්‍යතුමාගේ හා ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්යමණ්ඩලය පත්කිරීම ඇතුළු සියළු කටයුතු<br>ii. රා.සේ.අ.අරමුදලට අයදුම්පත් ඉදිරිපත් කිරීම. |

| | |
|---|---|
| 4. අමාත්‍යාංශ කාර්යය මණ්ඩලයට අදාල ණය සහ අත්තිකාරම් | i. දේපළ ණය ඉල්ලුම්පත් අනුමැතියට ඉදිරිපත් කර බැංකු වෙත ඉදිරිපත් කිරීම.<br>ii. ආපදා ණය/උත්සව අත්තිකාරම්/ විශේෂ අත්තිකාරම් ඉල්ලුම්පත් අනුමත කර ගෙවීම සඳහා ඉදිරිපත් කිරීම.<br>iii. ඇටෝර්නි බලපත්‍ර අවලංගු කිරීම හා ඔප්පු නිදහස් කිරීම. |
| 5. අග්‍රහාර රක්ෂණ කටයුතු | i. අමාත්‍යාංශ නිලධාරීන් ඉදිරිපත් කරන ලද අග්‍රහාර ප්‍රතිලාභ ඉල්ලුම් කිරීමේ අයදුම්පත් සහතික කර රක්ෂණ භාර ඒකකය වෙත ඉදිරිපත් කිරීම.<br>ii. විද්‍යුත් අග්‍රහාර කාඩ්පත් ලබාගැනීම සඳහා නිලධාරීන්ගේ අයදුම්පත් අග්‍රහාර භාර ඒකකය වෙත යැවීම හා ලද විද්‍යුත් අග්‍රහාර කාඩ්පත් නිලධාරීන්ට බෙදාදීම. |
| 6. මැතිවරණ රාජකාරි | පළාත් සහා මැතිවරණ වෙනුවෙන් මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් දෙනු ලැබූ උපදෙස් අනුව අවශ්‍ය කටයුතු කිරීම |
| 7. විනය කටයුතු | i. විනය පරීක්ෂණ සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉල්ලා ඇති කරුණු /වාර්තා ඉදිරිපත් කිරීම.<br>ii. වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රේ.104/මු.රේ.105 වාර්තා සකස් කිරීම හා අවශ්‍ය ලියවිලි ගෙන්වා ගොනු සකස් කිරීම.<br>iii. වාහන අනතුරු සම්බන්ධයෙන් විමර්ශණය කිරීමට පරීක්ෂණ මණ්ඩලය පත් කිරීම. |
| 8. මාධ්‍ය ඒකකයේ බිල්පත් | ගරු ඇමතිතුමා සහ ගරු නියෝජ්‍ය ඇමතිතුමා සහභාගී වූ නිල උත්සව වලදී ලබා ගන්නා ලද ඡායාරූප හා වීඩියෝ පට වලට අදාල බිල්පත් පියවීමට අදාල වවුචර සකස් කර ගිණුම් අංශයට යැවීම. |
| 9. දුරකථන/ජල/විදුලි/නිල නිවාස/වර්පනම් සම්බන්ධ කටයුතු | i. ගරු ඇමතිතුමාගේ සහ නියෝජ්‍ය ඇමතිතුමාගේ කාර්යාල, නිවාස, ජංගම සහ අන්තර්ජාල දුරකථන බිල්පත් පියවීම.<br>ii. අමාත්‍යාංශ ලේකම් සහ කාර්ය මණ්ඩලයේ සෘජු දුරකථන, නිවාස දුරකථන, ජංගම සහ අන්තර්ජාල දුරකථන බිල්පත් පියවීම.<br>iii. නව දුරකථන සඳහා ගෙවීම් සිදු කිරීම.<br>iv. ජල, විදුලි බිල්පත් නිරවුල් කිරීම. |
| 10. පවිත්‍රතා කටයුතු | පවිත්‍රතා කටයුතු සඳහා ගෙවීම් සිදු කිරීම. |
| 11. ඡායා පිටපත් යන්ත්‍රය සහ ආයතන ෆැක්ස් යන්ත්‍රය පිළිබඳ කටයුතු | i. නඩත්තුව<br>ii. දිරි දීමනාව පවත්වාගෙන යාම. |
| 12. කණිෂ්ඨ සේවක නිල ඇඳුම් සම්බන්ධ කටයුතු | වාර්ෂික නිල ඇඳුම් රෙදි ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම. |

| | |
|---|---|
| 13. හැඳුනුම්පත් හා දුම්රිය, බස් නිදහස් ගමන් බලපත් ආශ්‍රිත කටයුතු | i. හැඳුනුම්පත් නිකුත් කිරීම හා පරිපාලනය<br>ii. දුම්රිය, බස් ගමන් බලපත්‍ර ක්‍රියාවලිය ආශ්‍රිත කටයුතු |
| 14. පුවත්පත් සම්බන්ධ කටයුතු | පුවත්පත් ලබා ගැනීම් සම්බන්ධ කටයුතු හා බිල්පත් ගෙවීම් සම්බන්ධ කටයුතු |
| 15. සංග්‍රහ වියදම් සම්බන්ධ කටයුතු | අමාත්‍යාංශයේ සංග්‍රහ වියදම් සම්බන්ධ කටයුතු |
| 16. බාහිර ආයතන හා සබඳතා | i. විවිධ ක්ෂේත්‍රයන් සම්බන්ධව බාහිර ආයතන හා සම්බන්ධීකරණය<br>ii. බාහිර ආයතනයන් දන්වනු ලබන කරුණු පිළිබඳව අභ්‍යන්තරය දැනුවත් කිරීම. |
| 17. නිවාඩු සම්බන්ධ කටයුතු | i. අමාත්‍යාංශයේ කාර්යය මණ්ඩල මාසික පැමිණීමේ හා පිටවීමේ වාර්තාවන් ලබා ගැනිම.<br>ii. නිවාඩු ලේඛන යාවත්කාලීන කිරීම.<br>iii. රාජකාරී නිවාඩු ලේඛනගත කිරීම සහ ලිපිගොනු පවත්වාගෙන යාම.<br>iv. ගමන් වියදම්, නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර නිකුත් කිරීම සහ බිල්පත් පියවීම.<br>v. විදේශ නිවාඩු, ප්‍රසූත නිවාඩු ලේඛනගත කිරීම සහ ලිපිගොනු පවත්වාගෙන යාම. |
| 18. සංචාරක බංගලා | i. දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් සංචාරක බංගලා වෙන්කිරීම හා ඊට අයත් මුදල් දුම්රිය දෙපාර්තමේන්තුවට ප්‍රතිපූර්ණය කිරීම.<br>ii. ඊට අයත් ලේඛණ පවත්වා ගෙන යාම. |
| 19. අමාත්‍යාංශ ගොඩනැගිලි සම්බන්ධ කටයුතු | I. අමාත්‍යාංශ ගොඩනැගිලි වල අවශ්‍යතා හා අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට අවශ්‍ය දෑ සිදු කිරීම.<br>II. නව රථගාල සංවර්ධනය සඳහා අවශ්‍ය ලේඛන පවත්වා ගෙන යාම. |
| 20. විගණන කටයුතු | විගණන විමසුම් වාර්තා සකස් කිරීමට අවශ්‍ය තොරතුරු ලබා දීම. |
| 21. වට්ටෝරු භාණ්ඩ | අමාත්‍යාංශ ඉන්වෙන්ට්‍රිගත ලේඛන, බඩු වට්ටෝරු පොත් පවත්වා ගෙන යාම හා යාවත්කාලීන කිරීම |
| 22. දැයට කිරුළ | දැයට කිරුළ 2014 ප්‍රදර්ශනයට අදාල කටයුතු සිදු කිරීම |
| 23. රාජ්‍ය ආයතන වල ලිපිනයන් වෙනස් කිරීම. | මේ යටතේ අමාත්‍යාංශයට ලැබෙන ලිපිනයන් හෝ දුරකථන අංක වෙනස්වීම පිළිබදව අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන දැනුවත් කිරීම. |
| 24. සහනදායී මෝටර් රථ බලපත්‍ර ලබාදීම. | අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවල හිමිකම් ඇති නිලධාරීන් සඳහා සහනදායී මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීම. |
| 25. මාණ්ඩලික නිලධාරී රැස්වීම් | මාණ්ඩලික නිලධාරීන් සඳහා රැස්වීම් සංවිධානය කිරීම. |

| | |
|---|---|
| 26. අභ්‍යන්තර පාලන අංශයේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් | අභ්‍යන්තර පාලන අංශයේ නිලධාරීන් හට පුහුණු වැඩසටහන් සඳහා සහභාගී කරවීමේ කටයුතු |
| 27. ලේඛනාගාරයේ කාර්යභාරය | i. පෞද්ගලික ලිපි ගොනු නඩත්තු කිරීම.<br>ii. මුද්‍රිත ආකෘති |
| 28. බඳවා ගැනීමේ පටිපාටි | සකස් කිරීමට අදාල සියලු කටයුතු |
| 29. අමාත්‍යාංශයේ කළමනාකරණ ප්‍රතිසංස්කරණ සංසද ක්‍රියාවලිය | අවශ්‍ය කාර්යයන් ඉටු කිරීම. |
| 30. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම. | අදාළ කටයුතු ඉටු කිරීම. |
| 31. ඩෙංගු මර්ධන වැඩසටහන | අදාළ කටයුතු ඉටු කිරීම. |

## 3. මූල්‍ය කළමනාකරණය හා ප්‍රගතිය

### 3.1 ප්‍රසම්පාදන කමිටු

| | | 2013 වර්ෂයේදී ක්‍රියාත්මකවූ ප්‍රසම්පාදන ගණන | 2013 වර්ෂයේදී ක්‍රියාත්මකවූ ප්‍රසම්පාදන ගණන |
|---|---|---|---|
| 01 | අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ප්‍රසම්පාදන කමිටු | 08 | 01 |
| 02 | අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු | 33 | 14 |

### 3.2 මූල්‍ය කළමනාකරණය

| | | |
|---|---|---|
| 01 | 2013 වසරට වෙන් කර ඇති ප්‍රතිපාදන සහ සත්‍ය වියදම | අදාල වාර්තා අමුණා ඇත |
| 02 | ප්‍රතිපාදන ඉක්මවා වියදම් කල වැය ශීර්ෂ | නැත |
| 03 | කාර්යක්ෂමතාවය වැඩි කිරීමට කල කාර්යයන් | අළුතින් පැමිණි නිලධාරීන් විෂයය සම්බන්ධ පුහුණු පාඨමාලාවන්ට සහභාගී කල අතර, අනෙකුත් නිලධාරීන් කාර්යක්ෂමතාවයෙන් යුතුව රාජකාරි කටයුතු කරගෙන යනු ලබයි. |
| 04 | 2013 වර්ෂයේ ගිණුම් වාර්තා සකස් කිරීම හා භාණ්ඩාගාරය සමඟ සැසදීම | සියළුම වාර්තා සකස් කර, භාණ්ඩාගාර පොත් සමඟ සසඳා ඇත. |

**EEXPENDITURE REPORT As At 31.12.2013**

**Head - 114 - Ministry of Transport**

**Programme - 01 - Operational Activities**

**Project - 01 - Minister's office**

| ub Project | Object Code | Category/Object Title | Total Net Provision | Total Actual Expenditure end of December | % |
|---|---|---|---|---|---|
| 0 | | **Recurrent Expenditure** | **52,750,000.00** | **46,889,602.69** | **88.89** |
| | | **Personal Emoluments** | **13,987,313.00** | **13,333,579.87** | 95.33 |
| | 1001 | Salaries & Wages | 8,000,000.00 | 7,648,798.20 | 95.61 |
| | 1002 | Overtime and Holiday payments | 1,987,313.00 | 1,987,312.07 | 100.00 |
| | 1003 | Other Allowances | 4,000,000.00 | 3,697,469.60 | 92.44 |
| | | **Travelling Expenses** | **2,969,647.00** | **2,720,944.80** | 91.63 |
| | 1101 | Domestic | 1,469,647.00 | 1,469,647.00 | 100.00 |
| | 1102 | Foreign | 1,500,000.00 | 1,251,297.80 | 83.42 |
| | | **Suppliers** | **14,850,000.00** | **13,557,384.77** | 91.30 |
| | 1201 | Stationery & Office Requisites | 2,750,000.00 | 2,066,306.25 | 75.14 |
| | 1202 | Fuel | 12,000,000.00 | 11,472,602.52 | 95.61 |
| | 1203 | Diets & Uniform | 100,000.00 | 18,476.00 | 18.48 |
| | | **Maintenance Expenditure** | **11,400,000.00** | **8,943,705.80** | 78.45 |
| | 1301 | Vehicles | 10,200,000.00 | 8,744,396.20 | 85.73 |
| | 1302 | Plant Machinery & Equipment | 900,000.00 | 183,759.60 | 20.42 |
| | 1303 | Building & Structures | 300,000.00 | 15,550.00 | 5.18 |
| | | **Services** | **9,543,040.00** | **8,333,987.45** | 87.33 |
| | 1401 | Transport | 3,893,380.00 | 3,893,380.00 | 100.00 |
| | 1402 | Postal & Communication | 2,500,000.00 | 2,285,260.73 | 91.41 |
| | 1403 | Electricity & Water | 849,660.00 | 54,863.62 | 6.46 |
| | 1405 | Other | 2,300,000.00 | 2,100,483.10 | 91.33 |
| | | **Capital Expenditure** | **5,409,018.00** | **2,515,626.36** | **46.51** |
| | | **Rehabilitation and Improvement of Capital Assets** | **3,900,000.00** | **2,310,438.37** | 59.24 |
| | 2001 | Building & Structures | 800,000.00 | 620,256.00 | 77.53 |
| | 2002 | Plant Machinery & Equipment | 600,000.00 | 0.00 | 0.00 |
| | 2003 | Vehicles | 2,500,000.00 | 1,690,182.37 | 67.61 |
| | | **Acquisition of Capital Assets** | **1,509,018.00** | **205,187.99** | 13.60 |
| | 2102 | Furniture & office Equipment | 600,000.00 | 140,737.99 | 23.46 |
| | 2103 | Plant Machinery & Equipment | 0.00 | | |
| | | Media Unit Equipment | 800,000.00 | 52,200.00 | 6.53 |
| | | Other Machinery | 109,018.00 | 12,250.00 | 11.24 |
| | | **Project Total** | **58,159,018.00** | **49,405,229.05** | **84.95** |

**EXPENDITURE REPORT As At 31.12.2013**

**Head - 114 - Ministry of Transport**

**Programme - 01 - Operational Activities**

**Project - 02 - Administration & Establishment Services**

| Sub Project | Object Code | Category/Object Title | Total Net Provision | Total Actual Expenditure end of December | % |
|---|---|---|---|---|---|
| **0** | | **Recurrent Expenditure** | **101,500,000.00** | **94,010,093.86** | **92.62** |
| | | **Personal Emoluments** | **57,084,480.00** | **52,878,171.00** | 92.63 |
| | 1001 | Salaries & Wages | 36,451,049.00 | 32,244,741.32 | 88.46 |
| | 1002 | Overtime and Holiday payments | 2,510,647.00 | 2,510,646.49 | 100.00 |
| | 1003 | Other Allowances | 18,122,784.00 | 18,122,783.19 | 100.00 |
| | | **Travelling Expenses** | **2,422,331.00** | **2,422,330.10** | 100.00 |
| | 1101 | Domestic | 711,607.00 | 711,606.92 | 100.00 |
| | 1102 | Foreign | 1,710,724.00 | 1,710,723.18 | 100.00 |
| | | **Suppliers** | **11,450,000.00** | **10,624,411.63** | 92.79 |
| | 1201 | Stationery & Office Requisites | 5,250,000.00 | 4,999,244.35 | 95.22 |
| | 1202 | Fuel | 6,000,000.00 | 5,478,032.28 | 91.30 |
| | 1203 | Diets & Uniform | 200,000.00 | 147,135.00 | 73.57 |
| | | **Maintenance Expenditure** | **9,893,189.00** | **9,096,704.13** | 91.95 |
| | 1301 | Vehicles | 7,000,000.00 | 6,934,999.74 | 99.07 |
| | 1302 | Plant Machinery & Equipment | 1,893,189.00 | 1,893,188.64 | 100.00 |
| | 1303 | Building & Structures | 1,000,000.00 | 268,515.75 | 26.85 |
| | | **Services** | **19,500,000.00** | **18,409,500.09** | 94.41 |
| | 1401 | Transport | 1,600,000.00 | 1,499,740.32 | 93.73 |
| | 1402 | Postal & Communication | 3,000,000.00 | 2,700,862.50 | 90.03 |
| | 1403 | Electricity & Water | 7,000,000.00 | 6,962,925.24 | 99.47 |
| | 1404 | Rents and Local Taxes | 150,000.00 | 126,000.00 | 84.00 |
| | 1405 | Other | | | |
| | | Dayata Kirula | 3,000,000.00 | 2,393,258.47 | 79.78 |
| | | Other (Including Cleaning Service) | 4,750,000.00 | 4,726,713.56 | 99.51 |
| | | **Transfers** | **600,000.00** | **565,331.91** | 94.22 |
| | 1506 | Property Loan Interest to Public Servants | 600,000.00 | 565,331.91 | 94.22 |
| | | **Other Recurrent Expenditure** | **50,000.00** | **0.00** | 0.00 |
| | 1701 | Losses And Write Off | 50,000.00 | | 0.00 |
| 1 | | **Uthuru Mithutu Development Programme** | **500,000.00** | **13,645.00** | 2.73 |
| | 1405 | Other | 500,000.00 | 13,645.00 | 2.73 |
| | | **Capital Expenditure** | **6,990,982.00** | **3,755,500.07** | 53.72 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | **Rehabilitation and Improvement of Capital Assets** | **2,600,000.00** | **1,573,601.56** | 60.52 |
| | 2001 | Building & Structures | 500,000.00 | 103,201.56 | 20.64 |
| | 2002 | Plant Machinery & Equipment | 600,000.00 | 0.00 | 0.00 |
| | 2003 | Vehicles | 1,500,000.00 | 1,470,400.00 | 98.03 |
| | | **Acquisition of Capital Assets** | **2,390,982.00** | **1,698,456.31** | 71.04 |
| | 2102 | Furniture & office Equipment | 1,000,000.00 | 307,474.55 | 30.75 |
| | 2103 | Plant Machinery & Equipment | 1,390,982.00 | 1,390,981.76 | 100.00 |
| | | **Capacity Building** | **2,000,000.00** | **483,442.20** | 24.17 |
| | 2401 | Training and Capacity Building | | | |
| | | Training and Capacity Building | 2,000,000.00 | 483,442.20 | 24.17 |
| | | **Project Total** | **108,490,982.00** | **97,765,593.93** | **90.11** |

**EXPENDITURE REPORT As At 31.12.2013**

**Head - 114 - Ministry of Transport**

**Programme - 0 2 - Development Activities**

**Project - 03 - Development of Road Transport**

| Sub Project | Object Code | Category/Object Title | Total Net Provision | **Total Actual Expenditure end of December** | % |
|---|---|---|---|---|---|
| | | **Recurrent Expenditure** | **6,877,750,000.00** | **6,752,301,805.86** | **98.18** |
| **1** | | **Sri Lanka Transport Board** | **6,856,750,000.00** | **6,733,501,805.86** | 98.20 |
| | 1503 | **Public Institution** | | | |
| | | School & Higher Education Season Ticket Subsidy | 1,430,000,000.00 | 1,430,000,000.00 | 100.00 |
| | | Armed Forces - Bus Passes | 291,750,000.00 | 168,501,805.86 | 57.76 |
| | | Grants to SLTB - Operating on Unremunerative Routes | 2,335,000,000.00 | 2,335,000,000.00 | 100.00 |
| | | Financial Assistance to SLTB | 2,800,000,000.00 | 2,800,000,000.00 | 100.00 |
| **3** | | **Lakdiva Engineering Company (Pvt.) Ltd.** | **21,000,000.00** | **18,800,000.00** | 89.52 |
| | 1503 | Public Institution | 21,000,000.00 | 18,800,000.00 | 89.52 |
| | | | | | |
| | | **Capital Expenditure** | **1,930,000,000.00** | **1,238,052,017.13** | **64.15** |
| **1** | | **Sri Lanka Transport Board** | **1,920,000,000.00** | **1,237,219,409.58** | 64.44 |
| | 2201 | **Public Institution** | | | |
| | | Purchase of New Buses/ Engine kits | 1,000,000,000.00 | 380,242,080.00 | 38.02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | Bus Fleet Augmentation, Institutional Development and Capacity Building | 900,000,000.00 | 853,626,220.00 | 94.85 |
| | | Dayata Kirula | 20,000,000.00 | 3,351,109.58 | 16.76 |
| **5** | | **Implementation of Strategic Plan for Traffic Management (TEC is Rs: 10bn)** | **10,000,000.00** | **832,607.55** | 8.33 |
| | 2502 | Other Investments | 10,000,000.00 | 832,607.55 | 8.33 |
| | | **Project Total** | **8,807,750,000.00** | **7,990,353,822.99** | 90.72 |

**EXPENDITURE REPORT As At 31.12.2013**

**Head - 114 - Ministry of Transport**

**Programme - 02 - Operational Activities**

**Project - 04 - Development of New Rail Road**

| Sub Project | Object Code | Category/Object Title | Total Net Provision | **Total Actual Expenditure end of December** | % |
|---|---|---|---|---|---|
| | | **Capital Expenditure** | **4,056,000,000.00** | **3,310,552,114.27** | **81.62** |
| **1** | | **Matara - Beliatta-Kataragama New Rail line** | **4,000,000,000.00** | **3,298,958,452.33** | 82.47 |
| | 2104 | Building & Structures | **3,550,000,000.00** | **3,272,221,301.02** | 92.18 |
| | | | 3,200,000,000.00 | 3,200,000,000.00 | 100.00 |
| | | | 350,000,000.00 | 72,221,301.02 | 20.63 |
| | 2105 | Lands and Land Improvements | **450,000,000.00** | **26,737,151.31** | 5.94 |
| | | Lands Acquisition & Payment of Compensation | 200,000,000.00 | 21,234,742.07 | 10.62 |
| | | Detail design investigation & Collection of Base Line data | 50,000,000.00 | 3,931,170.82 | 7.86 |
| | | Relocation of Infrastructure facilities & Clearing of Railway Trace | 200,000,000.00 | 1,571,238.42 | 0.79 |
| **4** | | **Kottawa-Horana - Rail Line** | **6,000,000.00** | **0.00** | 0.00 |
| | 2105 | Lands and Land Improvements | 6,000,000.00 | 0.00 | 0.00 |
| **5** | | **Kurunegala - Habarana Rail track project** | **10,000,000.00** | **3,618,064.80** | 36.18 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 2105 | Lands and Land Improvements | 10,000,000.00 | 3,618,064.80 | 36.18 |
| **6** | | **Colombo - Hambantota (kelanivally) Line Extension project** | **15,000,000.00** | **0.00** | 0.00 |
| | 2105 | Lands and Land Improvements | 15,000,000.00 | 0.00 | 0.00 |
| **7** | | **Madawachchiya - Trincomalee Rail Line Feasibility Study** | **10,000,000.00** | **6,752,740.00** | 67.53 |
| | 2105 | Lands and Land Improvements | 10,000,000.00 | 6,752,740.00 | 67.53 |
| **8** | | **Wellavaya - Bibila - Badulla New Rail Line** | **10,000,000.00** | **1,222,857.14** | 12.23 |
| | 2105 | Lands and Land Improvements | 10,000,000.00 | 1,222,857.14 | 12.23 |
| **9** | | **Trincomalee - Maho - Puttalam New Rail Line** | **5,000,000.00** | **0.00** | 0.00 |
| | 2105 | Lands and Land Improvements | 5,000,000.00 | 0.00 | 0.00 |
| | | **Project Total** | **4,056,000,000.00** | **3,310,552,114.27** | **81.62** |
| | | | | | |
| | | **HEAD RECCURENT TOTAL** | **7,032,000,000.00** | **6,893,201,502.41** | **98.03** |
| | | **HEAD CAPITAL TOTAL** | **5,998,400,000.00** | **4,554,875,257.83** | **75.93** |
| | | **HEAD TOTAL** | **13,030,400,000.00** | **11,448,076,760.24** | **87.86** |

## 4. 2013 වර්ෂය තුලදී සැලසුම් අංශය විසින් ඉටු කරන ලද කාර්යයන්

1. දුම්රිය දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංගම, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය, ලක්දිව ඉංජිනේරු සමාගම හා මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව යන ආයතන සමඟ සංවර්ධන කටයුතු පිළිබද සම්බන්ධීකරණ රැස්වීම් පැවැත්වීම.

2. 2013 වර්ෂය සඳහා අමාත්‍යාංශය සහ අදාල ආයතන සමඟ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා පූර්ව වැඩමුළු පැවැත්වීම හා එම කටයුතු සම්බන්ධීකරණය.

3. 2013 වර්ෂයේ ප්‍රවාහන අමාත්‍යාංශයේ විවිධ ආයතන මගින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති සහ ඒ ඒ ආයතන වල ප්‍රගතිය හා ඇගයීම් කටයුතු ප්‍රතිඵල පාදක කළමනාකරණය යටතේ සිදුකරන ආකාරය පිළිබඳ වැඩමුළු පැවැත්වීම.

4. 2013 වර්ෂය සඳහා ප්‍රවාහන අමාත්‍යාංශ කාර්යාලයේ ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීම.

5. අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වල මාසික හා කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම හා ප්‍රගති සමාලෝචන කටයුතු සිදුකිරීම.

6. ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් දිස්ත්‍රික් මට්ටමින් පවත්වන ලද දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම් වලට සහභාගි වීම සහ ප්‍රවාහන අමාත්‍යාංශය සම්බන්ධව ගනු ලැබු තීරණ පිළිබඳව ඉදිරි කටයුතු තීරණය කිරීම.

7. 2014 අයවැය ඇස්තමේන්තු පිළියෙළ කිරීම සඳහා ආයතන සම්බන්ධීකරණය සහ එම සාකච්ඡා වලට සම්බන්ධ වෙමින් ගිණුම් අංශය සමඟ කටයුතු කිරීම.

8. ප්‍රවාහන අමාත්‍යාංශයේ ටෙන්ඩර්/තාක්ෂණ කමිටු රැස්වීම් වලට සහභාගී වීම සහ ඊට අදාල කටයුතු සිදුකිරීම.

9. මිලියන 50 ට වැඩි ප්‍රවාහන අමාත්‍යාංශයට සම්බන්ධ ව්‍යාපෘති වල ප්‍රගතිය අධීක්ෂණය කිරීම, වාර්තා පිළියෙළ කිරීම හා මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම.

10. 2014 පාර්ලිමේන්තු අයවැය කාරක සභා අවස්ථාවට ඉදිරිපත් කිරීම සඳහා වූ 2013 ප්‍රගති වාර්තාව සකස් කිරීම හා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

11. 2012 වර්ෂ අවසානයේ අමාත්‍යාංශ කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව සකස් කර ඉදිරිපත් කිරීම.

12. ප්‍රවාහන ක්ෂේත්‍රයට අදාලව බාහිර පාර්ශවකරුවන් විසින් ඉදිරිපත් කර ඇති ව්‍යාපෘති (Unsolicited Project Proposals) සම්බන්ධයෙන් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, අමාත්‍ය මණ්ඩලය විසින් පත්කර ඇති විශේෂ කමිටුව සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීම, සාකච්ඡා වලට සහභාගි වීම හා අදාල සම්බන්ධීකරණ කාර්යයන් සිදුකිරීම.

13. ශ්‍රී ලංකාවේ අගනුවර හා තදාසන්න ප්‍රදේශ වලට අදාල ප්‍රධාන ප්‍රවාහන සැලැස්මක් සකස් කිරීම සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය සමඟ එක්ව Urban transport System Development Project for Colombo Metropolitan Region and Suburb ව්‍යාපෘතියට අදාල කටයුතු කිරීම.

14. ප්‍රවාහන අමාත්‍යාංශයට අයත් වෙබ් අඩවිය වරින් වර යාවත්කාලීන කිරීම හා පවත්වාගෙන යාම.

15. ජාතික තොරතුරු කේන්ද්‍රය (1919) හා ICTA ආයතනය සමඟ එක්වී ප්‍රවාහන අමාත්‍යාංශයට අයත් තොරතුරු හුවමාරු කර ගැනීම හා මහජන පැමිණිලි සඳහා කඩිනම් පිළිතුරු ඉදිරිපත් කිරීම.

16. දුම්රිය මාර්ගයේ ඇති අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග සඳහා ආරක්ෂිත ගේට්ටු ඉදිකිරීමට අවශ්‍ය මූලික කටයුතු සම්බන්ධීකරණය කිරීම.

17. අනෙකුත් රේඛීය අමාත්‍යාංශ හා විවිධ ආයතන විසින් මෙහෙයවනු ලබන සංවර්ධන කටයුතු වලදී අදාල රැස්වීම් හා වැඩමුළු සඳහා සහභාගී වෙමින් අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.

- ජාතික ආපදා ආරක්ෂණ ක්‍රියාත්මක සැලැස්ම
- වයස්ගතවීම ආශ්‍රිත ජාතික ක්‍රියාත්මක සැලැස්ම.
- කාලගුණ විපර්යාස වලට මුහුණදීමේදී පෙර සූදානම් අවශ්‍යතා තක්සේරු කිරීමේ වැඩසටහන
- ආබාධිත පුද්ගලයන් සඳහා වූ ප්‍රජා පාදක වැඩසටහන
- පාරිභෝගික සුහසාධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති රාමුවක් සැකසීම
- මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිඵල පාදක කරගත් කළමනාකරණ වැඩසටහන
- බලශක්ති විවිධාංගීකරණය වැඩිදියුණු කිරීමට අදාල ව්‍යාපෘතිය
- ජාතික මානව සම්පත් හා රැකී රක්ෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන
- ළමා මිතුරු පාසැල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ බහු අංශික වැඩසටහන
- මානව අයිතිවාසිකම් සඳහා වූ අන්තර් අමාත්‍යාංශයීය මෙහෙයුම් කමිටුව

18. ශ්‍රී ලංකාවේ පවත්වන ලද 2013 පොදු රාජ්‍ය මණ්ඩලීය නායක සමුළුව සංවිධානයේදී ප්‍රවාහන කටයුතු පැවරුනු කමිටුවට අදාලව මූලික කටයුතු සම්බන්ධීකරණය කිරීම.

19. ශ්‍රී ලංගම හා පෞද්ගලික බස් රථ ධාවනය ඒකාබද්ධ කාල සටහනකට අනුව සිදුකිරීමට අදාල සංවිධාන කටයුතු සම්බන්ධීකරණය කිරීම.

20. කාර්යාලීය පැරණි ලිපිගොනු ලෙජරය ක්‍රමවත්ව සැකසීම හා ලිපිගොනු නවීකරණය කිරීම.

21. ශ්‍රී ලංකාවේ අගනුවර හා තදාසන්න ප්‍රදේශ වල ප්‍රවාහන ක්ෂේත්‍රයෙන් විමෝචනය වන හරිතාගාර වායු අඩුකිරීමේ සැලැස්මක් සකස් කිරීම සඳහා ලෝක බැංකුව සමඟ එක්ව Colombo Low Carbon Urban Transport Study ව්‍යාපෘතිය ආරම්භ කිරීම.

22. පුද්ගලික ප්‍රවාහන අමාත්‍යාංශය හා සම්බන්ධීකරණය කරමින් ජාතික ප්‍රවාහන ප්‍රතිපත්ති සංශෝධනය කිරීමට අවශ්‍ය මූලික කටයුතු ක්‍රියාත්මක කිරීම.

23. උතුරු දුම්රිය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති වලට අදාල ව්‍යාපෘති කාර්යාල හා සම්බන්ධීකරණය සිදුකරමින් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් පිළිබඳව පසුවිපරම් කටයුතු සිදුකිරීම.

24. අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වලට අදාල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලට සහභාගීවීම හා තීරණ ක්‍රියාත්මක කිරීමේ පසුවිපරම් කටයුතු සිදුකිරීම.

25. 2014 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ පැවැත්වීමට නියමිත ආසියානු කලාපීය තිරසාර පාරිසරික ප්‍රවාහන සමුළුවේ සංවිධානයට අදාල මූලික කටයුතු සම්බන්ධීකරණය කිරීම.

26. ප්‍රවාහන අමාත්‍යාංශයේ පුස්තකාලය පවත්වාගෙන යාම.

27. දක්ෂිණ අධිවේගී මාර්ගය කොළඹ දිශාවට දික් කිරීමේ මහාමාර්ග අමාත්‍යාංශයේ ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව නියෝජනය කිරීම.

28. ප්‍රවාහන අමාත්‍යාංශයට අදාලව වත්මන් ප්‍රගතිය ඇතුලත් කෙටි වාර්තාමය චිත්‍රපටය සම්පාදනය කිරීම.

29. SAARC/UNESCAP වැනි ජාත්‍යාන්තර සමුළු වලට අදාලව ප්‍රවාහන ක්ෂේත්‍රයේ ශ්‍රී ලංකාවේ නියෝජනයට අදාල කාර්යයන් සිදුකිරීම.

30. 2013 දැයට කිරුළ ප්‍රදර්ශනයට අදාල සියළුම කටයුතු සිදු කිරීම

## 5. 2013 වර්ෂයේදී අභ්‍යන්තර විගණන අංශය විසින් ඉටුකරන ලද විමර්ශන රාජකාරී පිළිබඳ විස්තර සාරාංශය

| | ආයතනය | සිදුකරන ලද පරීක්ෂණ සංඛ්‍යාව |
|---|---|---|
| 1. | ප්‍රවාහන අමාත්‍යාංශය | 03 |
| 2. | ශ්‍රී ලංගම | 15 |
| 3. | දුම්රිය දෙපාර්තමේන්තුව | 01 |
| 4. | ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය | 04 |
| 5. | ලක්දිව ඉංජිනේරු ආයතනය | 03 |
| 6. | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව | 01 |

## 6. නව දුම්රිය මාර්ග සංවර්ධන අංශය

පොදු ජනතාවට කාර්යක්ෂම හා ලාභදායී ප්‍රවාහන සේවාවක් ලබා දීම පිණිස තිරසාර ජාතික ප්‍රතිපත්තියක් ගොඩනැගීමේ අවශ්‍යතාව හඳුනාගනිමින් හා පොදු ප්‍රවාහන සේවාවන්ට ප්‍රමුඛතාවය ලබා දෙමින් දැනට වැඩි වශයෙන් මහා මාර්ග පද්ධතිය හරහා සිදුකෙරෙන මගී හා භාණ්ඩ ප්‍රවාහනය දුම්රිය සේවාව වෙත ආකර්ෂණය කරවීමේ අපේක්ෂාව ඇතිව, පවත්නා දුම්රිය මාර්ග පද්ධතිය වැඩි දියුණු කරන අතරම නව දුම්රිය මාර්ග ඉදිකිරීම තුලින් රටේ සියලුම ප්‍රදේශ ආවරණය වන පරිදි දුම්රිය පද්ධතියක් ව්‍යාප්ත කිරීමට රජය සැලසුම් කර ඇත.

ඒ අනුව යෝජිත නව දුම්රිය මාර්ග පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත වියදම (ඇ.ඩො.මිලියන) | ව්‍යාපෘති කාලය |
|---|---|---|---|
| 01 | මාතර - කතරගම නව දුම්රිය මාර්ගය (කි.මී.115) | 600 | 2006-2019 |
| 02 | කුරුණෑගල - හබරණ නව දුම්රිය මාර්ගය (කි.මී.80) | 225 | 2010-2016 |
| 03 | අවිස්සාවේල්ල - හම්බන්තොට නව දුම්රිය මාර්ගය (කි.මී.225) | 375 | 2009-2016 |
| 04 | පානදුර - හොරණ නව දුම්රිය මාර්ගය (කි.මී.) | 53 | 2013-2017 |

මීට අමතරව පහත සඳහන් නව දුම්රිය මාර්ග ඉදිකිරීමට අදාල මුලික අධ්‍යන කටයුතු ඉටුකිරීම පිණිස 2013 වර්ෂය සඳහා පහත දැක්වෙන පරිදි මුල්‍ය ප්‍රතිපාදන ලබා දී ඇත.

1. මැදවච්චි - ත්‍රිකුණාමලය - ප්‍රතිපාදනය රු.මි.10
2. වැල්ලවාය, බිබිල හරහා බදුල්ල - ප්‍රතිපාදනය රු.මි.10
3. ත්‍රිකුණාමලය, මහව හරහා පුත්තලම - ප්‍රතිපාදනය රු.මි.05

### 6.1 මාතර - කතරගම නව දුම්රිය මාර්ගය

පහත දැක්වෙන පරිදි අදියර තුනක් යටතේ ඉදිකිරීමේ කටයුතු නිම කිරීමට යෝජිත මෙම මාර්ගයේ සම්පූර්ණ දිග කි.මී.115 කි.

| | අදියර | දුර ප්‍රමාණය කි.මී. |
|---|---|---|
| I. | මාතර සිට බෙලිඅත්ත දක්වා | 27 |
| II. | බෙලිඅත්ත සිට හම්බන්තොට දක්වා | 48 |
| III. | හම්බන්තොට සිට කතරගම දක්වා | 40 |

මෙම ව්‍යාපෘතිය යටතේ දැනට නිම කර ඇති කටයුතු

- මාතර නිල්වලා ගඟ හරහා මීටර් 100 ක දිගින් යුතු පාලමක් ඉදි කර ඇත. එහි යටිතල ව්‍යුහය රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මඟින් ඉදි කරන ලද අතර උඩුතල ව්‍යුහය ඔස්ට්‍රියාවෙන් ආනයනය කොට සවිකර ඇත. පාලම සඳහා වැය කළ මුළු මුදල රුපියල් මිලියන 263 කි.
- පාරිසරික බලපෑම් ඇගයීම (EIA) වාර්තාව සකස් කර ඇති අතර මාතර සිට බෙලිඅත්ත දක්වා කොටසට අදාල වාර්තාව යාවත් කාලීන කර ඇත.
- භූ විද්‍යා සමීක්ෂණ හා පුරාවිද්‍යා ඇගයීම් කටයුතු අවසන් කර ඇත.
- පළමු අදියර යටතේ දුම්රිය මාර්ගය ඉදිකිරීම, නැවත පදිංචි කරවීමේ කටයුතු හා විකල්ප ප්‍රවේශ මාර්ග ඉදිකිරීම වෙනුවෙන් හෙක්ටයාර් 92.752 පමණ වූ ඉඩම් අත්පත් කරගෙන ඇති අතර ඉවත් කර ඇති නිවාස සංඛ්‍යාව 185 කි.

- පවරා ගෙන ඇති ඉඩම් (කැබලි සංඛ්‍යාව 1499) - හෙක්ටයාර් 95.752
- දුම්රිය මාර්ගය පිණිස අත්පත් කරගත් ඉඩම් - හෙක්ටයාර් 83.7316
- නැවත පදිංචි කරවීම පිණිස අත්පත් කරගත් ඉඩම් - හෙක්ටයාර් 8.6388
- විකල්ප මාර්ග ඉදිකිරීම පිණිස අත්පත් කරගත් ඉඩම් - හෙක්ටයාර් 2.4551

  (දියගහ මොටාගෙදර මාර්ගය, දෙල්ගල්ල මාර්ගය හා දේවානන්ද මාර්ගය)

- අනෙකුත් ඉදිකිරීම් පිණිස අත්පත් කරගත් ඉඩම් - හෙක්ටයාර් 1.3609
- නැවත පදිංචි කිරීමේ කටයුතු සඳහා විකල්ප ඉඩම් 10 ක් අත්පත් කරගෙන ඇති අතර පුද්ගලයන් 179 දෙනෙකු වෙත ඉඩම් කැබලි ලබා දී ඇත. ඉඩම් වල නිවාස 39 ක් ඉදිකිරීමේ කටයුතු අවසන් කර ඇති අතර තවත් නිවාස 04 ක් ඉදි වෙමින් පවතී.

විකල්ප ඉඩම් අත්පත් කර ගැනීම, සංවර්ධනය කිරීම හා බෙදා දීම

| ඉඩමේ නම | ඉඩම් කැබලි ගණන | බෙදා දී ඇති ඉඩම් කැබලි ගණන | සිදු කෙරෙන සංවර්ධන කාර්යයන් | ඉදි කර ඇති නිවාස ගණන | ඉදි කෙරෙමින් පවතින නිවාස ගණන |
|---|---|---|---|---|---|
| පල්ලියගුරුගේ වත්ත | 35 | 27 | a | 13 | 01 |
| සිල්වඩේල් වත්ත | 25 | 17 | b | 04 | 01 |
| ආචාරිගේ වත්ත | 43 | 25 | b | * | * |
| දංගහවත්ත | 12 | 12 | b | * | * |
| පාළුවත්ත | 53 | 53 | b | 18 | 01 |
| සන්නාසිගේ වත්ත | 25 | 20 | a | 01 | * |
| කරගහහේන | 26 | 10 | a | 03 | 01 |
| පන්සලගාව වත්ත | * | * | ) | * | * |
| මහ ගෙදර වත්ත | 9 | 9 | b | * | * |
| රුක්අත්තනගහ වත්ත | 13 | 6 | b | * | * |

a - මාර්ග සකස් කොට කොන්ක්‍රීට් යොදා ඇත.

b - ප්‍රවේශ මාර්ගවල මූලික වැඩ නිම කර ඇත.

c - ඉඩම් ශුද්ධ කර ඇත

d - සංවර්ධනය කරමින් පවතී

e - සංවර්ධන කටයුතු ආරම්භ කර නැත

- දුම්රිය මාර්ගය ඉදිකිරීම නිසා අහිමි වන පොදු ගොඩනැගිලි හා පූජනීය ස්ථාන සඳහා විකල්ප ගොඩනැගිලි ඉදිකිරීම.
  - සිරිපවර විජයාරාම විහාරස්ථානය - රු.මී. 8.5
  - වලස්ගල මැටි කර්මාන්ත ශාලාව - රු.මී. 9.0
  - වැව්දත්ත කණිටු විදුහල් ගොඩනැගිල්ල - } රු.මී. 8.0
  - වැව්රුකන්නල කණිටු විදුහල් ගොඩනැගිල්ල - } රු.මී. 8.0
  - සමෘද්ධි බැංකු ගොඩනැගිල්ල, වැව්රුකන්නල - රු.මී.9.6

  } වැඩ අවසන් කර ඇත

- පළමු අදියරේ ඉදිකිරීම් කටයුතු සඳහා 2013.02.19 දින චීනයේ CMC සමාගම සමඟ ණය ගිවිසුම අත්සන් කර ඇති අතර අවශ්‍ය ප්‍රතිපාදන වරණීය ණය ක්‍රමය යටතේ චීනයේ එක්සිම් බැංකුවෙන් ලබා දී ඇත. ඒ අනුව චීනයේ CMC සමාගම විසින් දුම්රිය ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කර දැනට ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී.

**ව්‍යාපෘතිය යටතේ දැනට සිදු කෙරෙමින් පවතින කටයුතු**

- පළමු අදියර යටතේ බෙලිඅත්ත පාළුවත්ත විකල්ප ඉඩමේ ප්‍රවේශ මාර්ග තාවකාලික සංවර්ධන කටයුතු වැඩ අවසන් කර ඇත.
- සන්නාසිගේවත්ත විකල්ප ඉඩම සංවර්ධනය කිරීමේ කටයුතු අවසන් කර ඇත.
- අහිමි වන ව්‍යාපාර ස්ථාන සඳහා කඩබිම් සංවර්ධනය කිරීමේ කටයුතු අවසන් කර ඇත.
- අත්කර ගෙන ඇති දුම්රිය මංතීරුව තුල විදුල රැහැන් කණු සහ දුරකථන රැහැන් කණු ඉවත් කිරීමේ 95% ක ප්‍රගතියක් ඇත.
- දුම්රිය මාර්ගයට අදාල සියලුම සැලසුම් සකස් කිරීම අවසන් කර ඇත. ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී.

**මුල්‍ය ප්‍රගතිය**

මෙම ව්‍යාපෘතිය සඳහා 2013 වර්ෂය වෙනුවෙන් ලැබී ඇති මුදල් රු.මි.4,000 ක් වන අතර 82.47% ක මුල්‍ය ප්‍රගතියක් පෙන්වමින් රු.මි. 3,298.96 ක මුදලක් අදාල වර්ෂය තුළ දී වැය කරනු ලැබ ඇත. සංවර්ධන ව්‍යාපෘතීන් වලට අනුකූල වන සේ අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව යෝජිත මාර්ගයේ වෙනස්වීම් හේතුවෙන් අපේක්ෂිත වියදම් මට්ටම ළගා කර ගැනීම අපහසු වී ඇත.

### 6.2 කැළණිවැලි දුම්රිය මාර්ගය අවිස්සාවේල්ල සිට හම්බන්තොට දක්වා දීර්ඝ කිරීම

2009 - 2016 කාලය තුළ ඉදිකිරීමට යෝජිත මෙම දුම්රිය මාර්ගයේ දිග කි.මී 225 කි. යෝජිත මාර්ගය පිළිබඳ ශක්‍යතා අධ්‍යයන කටයුතු සිදු කිරීම මොරටුව විශ්ව විද්‍යාලය විසින් සිදු කරමින් පවතී. ඇස්තමේන්තු ගත මුදල රු.මි. 10.83 වන අතර දැනට රු.මි. 5.41ක මුදලක් ශක්‍යතා අධ්‍යයන කටයුතු සඳහා වැය කර ඇත. 2013 වර්ෂය සඳහා කිසිදු වියදමක් ව්‍යාපෘතිය යටතේ සිදු කර නැත.

### 6.3 කුරුණෑගල - හබරණ නව දුම්රිය මාර්ගය

කිලෝමීටර් 80 ක දිගකින් යුත් මෙම ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයන කටයුතු ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) විසින් සිදු කරනු ලැබ ඇති අතර අවසන් වාර්තාව භාර දී ඇත. ඉදිකිරීම් සඳහා පරිසර අධිකාරියේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය විස්තරාත්මක පාරිසරික ඇගයීම් අධ්‍යයනය සිදුකිරීම සඳහා විවෘත ටෙන්ඩර් කැඳවා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියට අනුව අදාල ආයතනය සමග ගිවිසුම් ඇති කර ගැනීමට අවශ්‍ය කටයුතු යොදා ඇත. එබැවින් 2013 වර්ෂයට වෙන්කර ඇති මුදල වන රු.මි. 10 ක මුදලින් රු. මි. 3.6 ක් කුරුණෑගල මිණින්දෝරු බල ප්‍රදේශයට අයත් කොටසේ මධ්‍ය රේඛාව ලකුණු කිරීමට වියදම් කර ඇත.

### 6.4 හොරණ - කොට්ටාව නව දුම්රිය මාර්ගය

හොරණ පානදුර සඳහා කරන ලද ශක්‍යතා අධ්‍යයනයේදී සලකන ලද විකල්ප මාර්ගයක් වන හොරණ කොට්ටාව නව මාර්ගය දැනට පවතින දුම්රිය පද්ධතියට යා කිරීම වඩාත් යෝග්‍ය බව හඳුනාගෙන ඇත. මේ සඳහා කොට්ටාව නව ප්‍රවාහන කේන්ද්‍රස්ථානයක් වීම හේතු පාදක වී ඇත. ඉදිකෙරෙමින් පවතින අධිවේගී මාර්ගය ආශ්‍රිතව ඉදිරියේදී කොට්ටාව නගරය හා අවට ප්‍රදේශයේ සිදු වේ යැයි අපේක්ෂිත සංවර්ධන කටයුතු කේන්ද්‍ර කොට ගනිමින් මෙම යෝජිත දුම්රිය මාර්ගය වර්තමානයේ දී හොරණ පානදුර වෙනුවට හොරණ කොට්ටාව වශයෙන් වෙනස් වී ඇත. මොරටුව විශ්ව විද්‍යාලය විසින් සිදු කල ශක්‍යතා අධ්‍යයන කටයුතු අවසන් කර වාර්තාව මේ වන විට භාර දී ඇති අතර 2013 වර්ෂයට වෙන් කළ රු.මි. 6 න් කිසිදු වියදමක් ව්‍යාපෘතිය යටතේ සිදු කර නැත.

### 6.5 මැදවච්චිය - ත්‍රිකුණාමලය නව දුම්රිය මාර්ගය

කිලෝමීටර 80 ක පමණ දිගකින් යුත් මෙම ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයන කටයුතු කොළඹ විශ්ව විද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනය වෙතින් සිදු කරන අතර මේ වන විට කෙටුම්පත් වාර්තාව භාර දී ඇති අතර අවසන් වාර්තාව ලඟදීම ලබා දීමට නියමිතය. මෙම වර්ෂයට වෙන් කළ රු.මි. 10 න් රු. මි. 6.75 ක් මේ සඳහා වැය කර ඇත.

### 6.6 වැල්ලවාය - බදුල්ල නව දුම්රිය මාර්ගය

බදුල්ල සිට මොණරාගල හරහා වැල්ලවාය දක්වා නව දුම්රිය මාර්ගයක් ඉදිකිරීම යටතේ ඇඹිලිපිටිය සිට මොණරාගල, වැල්ලවාය, අම්පාර හරහා මඩකලපුව දක්වා දිවෙන සහ කතරගම සිට මේ මාර්ග යට සම්බන්ධ වන පරිදි විකල්ප මාර්ගයක්ද ලෙස දුම්රිය මාර්ග පද්ධතියක් සඳහා පූර්ව අධ්‍යයනයක් කිරීමට ඉන්ජිනේරුමය කාර්යන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශය වෙත පැවරීමට අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලැබී ඇත. ඒ සඳහා අදාල ආයතන සමග ගිවිසුම් ඇතිකර ගෙන ඇති අතර අධ්‍යයන කටයුතු ආරම්භ කර ඇත. 2013 වර්ෂය සඳහා රු. මි. 10ක ප්‍රතිපාදන ලැබී ඇති අතර අදාල කාර්යය වෙනුවෙන් අත්තිකාරම් වශයෙන් රු. මි. 1.2ක් වියදම් කර ඇත.

### 6.7 ත්‍රිකුණාමලය - පුත්තලම නව දුම්රිය මාර්ගය

ත්‍රිකුණාමලය සිට මහව හරහා කොළඹට දුම්රිය මාර්ගයක් ඇති බැවින් මහව සිට පුත්තලම දක්වා නව දුම්රිය මාර්ගයක් ඉදිකිරීම ප්‍රමාණවත් වේ. එබැවින් මහව සිට පුත්තලම දක්වා වූ නව දුම්රිය මාර්ග යක් සඳහා පූර්ව ශක්‍යතා අධ්‍යයනය අවසන් කර ඇත. මෙම අධ්‍යයනය අමාත්‍යාංශයේ හා දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් සිදුකරන ලදී. එබැවින් වෙන් කල ප්‍රතිපාදන ඉතිරි වී ඇත.

## 7. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

1998 අංක 5 දරණ මෝටර් වාහන සංශෝධන පනත මගින් ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව ක්‍රියාත්මකවේ. මෙම සභාව සභාපතිවරයෙකුගෙන් සහ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන 17 ක නියෝජිත කණ්ඩායමකින් සමන්විතවේ.

මෝටර් වාහන පනතේ 213 අ වගන්තියෙන් මෙම සභාවේ කාර්ය භාරය දක්වා ඇති අතර, 213 ආ වගන්තිය මගින් ''මාර්ග ආරක්ෂණ අරමුදල'' පිහිටුවා ඇත. මෙම අරමුදල සඳහා රක්ෂණ සමාගම් තම තෙවන පාර්ශවීය රක්ෂණයන්ගෙන් 1 % ක මුදලකින් දායක වේ.

**දැක්ම**

''සැමට සුරක්ෂිත මාර්ග''

**මෙහෙවර**

''මාර්ග අනතුරුවලින් තොර සමාජයක් බිහිකිරීම''

**මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කාර්ය භාරය**

- හඳුනා නොගත් වාහන වලින් අනතුරට පත් තැනැත්තන්ට වන්දි ගෙවීම.
- මාර්ග ආරක්ෂාව පිළිබඳ ව්‍යාපෘති සකස් කිරීම සහ ක්‍රියාවට නැංවීම.
- රජය හා රාජ්‍ය නොවන සංවිධාන තුළ මාර්ග ආරක්ෂාව හා සම්බන්ධිත කාර්යය සම්බන්ධීකරණය කිරීම.
- මාර්ග ආරක්ෂාව පිළිබඳ කටයුතු සඳහා මූල්‍යමය හා වෙනත් සහාය ලබා ගැනීම.

- මාර්ග ආරක්ෂාව හා සම්බන්ධිත ප්‍රතිපත්තීන් සහ ව්‍යාපෘති පිළිබඳව රජයට උපදෙස් දීම.
- සමාන ජාත්‍යන්තර ආයතන සමඟ සබඳතා පැවැත්වීම සහ පළපුරුද්ද පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම.
- සම්බන්ධිත විෂයයන් පිළිබඳ තොරතුරු රැස් කිරිම, පර්යේෂණ පැවැත්වීම සහ ක්ෂේත්‍ර පරීක්ෂණ පැවැත්වීම.
- මාර්ග ආරක්ෂාව පිළිබඳ දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම.
- මාර්ග ආරක්ෂාව විෂයයට අදාල පොත්පත් සහිත පුස්තකාලයක් පවත්වාගෙන යාම.

### 7.1 හඳුනා නොගත් වාහන වලින් අනතුරට පත් පුද්ගලයන් සඳහා වන්දි යෝජනා ක්‍රමය

මෝටර් වාහන පනතේ 213 අ වගන්තිය මඟින් දක්වා ඇති මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ ප්‍රධාන කාර්යයක් වන මෙම වන්දි යෝජනා ක්‍රමය මඟින් 2013.01.01 දිනෙන් පසුව සිදු වූ හඳුනා නොගත් වාහන අනතුරකින් තුවල ලබන පුද්ගලයෙකු සඳහා රු. 75000/= ක මුදලක් ද, මියයන පුද්ගලයෙකුගේ නීත්‍යානුකූල යැපෙන්නන් හට රු. 100,000/= ක මුදලක් ද වන්දි ලෙස ලබාදීමට කටයුතු කරයි.

2007 වසරේ මෙම යෝජනා ක්‍රමය ස්ථාපිත කළ අතර 2013 වර්ෂය තුළ ලැබී ඇති අයදුම්පත් අතරින්, අයදුම්පත් 77 ක් සඳහා 2013 වර්ෂය අවසාන වන විට වන්දි ප්‍රදානය කර ඇත. මේ සඳහා වැය කර ඇති මුදල රු.3,295,000 /= කි.

### 7.2 මාර්ග ආරක්ෂාවට අදාල වැඩසටහන්

- දකුණු පළාත් මාර්ග අනතුරු වැළැක්වීම පිළිබඳ පළාත් මාර්ග ආරක්ෂණ සැලැස්ම සකස් කිරීමේ වැඩමුළුව 2013.07.12 වන දින පැවැත්විණ.
- රිය අනතුරු වැළැක්වීම පිළිබඳ පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 03 ක් පවත්වා ඇත.
- ජෝන් කීල්ස් ආයතනයේ මූල්‍ය අනුග්‍රහය යටතේ එම ආයතනයේ සේවයේ නියුතු වෑන් රථ හා ට්‍රක් රථ රියදුරන් 150 දෙනෙක් සඳහා මාර්ග රිය අනතුරු අවම කිරිම සම්බන්ධයෙන් දේශන පවත්වන ලදි.
- අළුත්ගම ත්‍රිරෝද රථ රියදුරන් 600 දෙනෙකු සඳහා මාර්ග රිය අනතුරු අවම කිරීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත.
- දකුණු පළාත් රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් රාජ්‍ය නිලධාරීන් 150 ක ගේ සහභාගිත්වයෙන් පැවැත්විණ.
- පානදුර මාර්ග ආරක්ෂණ කමිටු නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් රාජ්‍ය නිලධාරීන් 50 ක ගේ සහභාගිත්වයෙන් පැවැත්විණ.
- කළුතර දිස්ත්‍රික් ලේකම් ශ්‍රවනාගාරයේදී රාජ්‍ය නිලධාරීන් 50 ක ගේ හා ග්‍රාම නිලධාරීන් 480 ක ගේ සහභාගීත්වයෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදි.
- දිස්ත්‍රික් සමාජ සේවා නිලධාරීන් හා රාජ්‍ය නිලධාරීන් 65 ක ගේ සහභාගීත්වයෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදි.

### 7.3 මාර්ග ආරක්ෂණ කොමිසම පිහිටුවීම සඳහා නීති සම්පාදනය.

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව, බලතල සහිත මාර්ග ආරක්ෂණ කොමිසම බවට පත්කිරීමේ පනත් කෙටුම්පත නැවත සංශෝධනය සහිතව මේ වන විට සකස් කරමින් පවතී.

# II කොටස

## අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්හි කාර්ය සාධනය

# 1. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

## 1.1 හැඳින්වීම

ජාතික ආර්ථික සංවර්ධනය සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දායකත්වය 2013 වර්ෂයේද අඛණ්ඩව ලබා දෙන ලද අතර එය මගී ප්‍රවාහනයෙන් 6 % ක් හා භාණ්ඩ ප්‍රවාහනයෙන් 2 % ක දායකත්වයකි.

**දැක්ම**

දකුණු ආසියාවේ වඩා කාර්යක්ෂම දුම්රිය ප්‍රවාහන සැපයුම්කරු බවට පත්වීම.

**මෙහෙවර**

මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා ආරක්ෂිත, විශ්වාසදායී, නියමිත වේලාවට ධාවනය වන, සකසුරුවම් හා කාර්යක්ෂම දුම්රිය ප්‍රවාහන සේවාවක් සැපයීම.

2012 වර්ෂය හා සසඳන විට 2013 වර්ෂයේ යහපත් ප්‍රගතියක් සපුරා ගැනීමට ශ්‍රී ලංකා දුම්රිය සේවය සමත් වී ඇත. මෙම ප්‍රවනතාවය සඳහා නව දුම්රිය බලවේග කට්ටල හඳුන්වා දීම, නව දුම්රිය සේවා හඳුන්වා දීම වැනි කරුණු ඉවහල් වී ඇත. තවද, දුම්රිය ඇණියේ කාර්යක්ෂමතාවය, මෙහෙයුම් අංශයේ ඇති වූ යහපත් වර්ධනය ආදී කරුණු මේ කෙරෙහි බලපා ඇත. මේ තුළින් වර්තමානයේ දුම්රිය වෙත වැඩි මගී නැඹුරුවක් දක්නට ලැබෙන අතර දුම්රිය ආදායමද ඉහළ ගොස් ඇති අතර 2012 වර්ෂයේ රුපියල් මිලියන 4851.86 ක් වූ මුළු ආදායම 2013 වර්ෂයේ රුපියල් මිලියන 5423.29 දක්වා වැඩිවී ඇත. තවද දුම්රිය අනතුරු අඩුවී තිබීම දුම්රිය හරස් මාර්ග අනතුරු අඩුවී තිබීම හා නියමිත වේලාවට දුම්රිය ධාවනය වීමේ ප්‍රතිශතය වැඩිවීම යන ගුණාත්මක අංශයන්ගේද යහපත් වර්ධනයක් පෙන්නුම් කරයි.

පහත සඳහන් ප්‍රධාන සංවර්ධන වැඩසටහන් ද මාර්ග ජාලයේ හා සංඥා පද්ධතියේ නඩත්තු කටයුතුද මෙම කාල වකවානුව තුළ ක්‍රියාත්මක කෙරිණි.

- මැදවච්චිය සිට මඩු දක්වා දුම්රිය මාර්ගය නැවත ඉදිකර මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා විවෘත කළ අතර එම මාර්ගයේ චෙට්ටිකුලම්, නෙරියකුලම්, මඩු පාර යන දුම්රිය ස්ථාන තනා නිමකිරීම.
- කොළඹ කොටුව-මහනුවර සුඛෝපභෝගී නව නගරාන්තර දුම්රිය සේවයක් හඳුන්වා දීම හා මීරිගම සහ කොළඹ කොටුව අතර නව දුම්රිය සේවයක් හඳුන්වා දීම.
- චීනයෙන් ආනයනය කරන ලද එස් 12 නව බලවේග කට්ටල කැළණිවැලි මාර්ගයේ දුම්රිය ධාවනය සඳහා යොදා ගැනීම.
- නවීන පහසුකම් වලින් සමන්විත එස් 12 බලවේග කට්ටල උඩරට මාර්ගයේ බදුල්ල දක්වා ධාවනය වන පොඩි මැණිකේ සහ උඩරට මැණිකේ දුම්රියන් සඳහා යොදා ගැනීම.
- ප්‍රධාන මාර්ගයේ බදුල්ල දක්වා නව බලවේග කට්ටල (එස් 12) සහිත වායුසමීකරණය කරන ලද දුම්රිය හඳුන්වා දීම.
- මුහුදුබඩ දුම්රිය මාර්ගය නවීකරණය කර එස් 11 නව බලවේග කට්ටල යොදා ගනිමින් අමතර දුම්රියන් ධාවනය සඳහා යොදා ගැනීම.

- දුම්රිය ස්ථානවල මගී පහසුකම් වර්ධනය කිරීම.
    - ➢ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර දුම්රිය ස්ථානවල ස්ථාපනය කිරීම.
    - ➢ මරදාන හා කොළඹ කොටුව දුම්රිය ස්ථානවල CC TV සවිකිරීම සඳහා මූලික පියවර ගැනීම.
    - ➢ මගී විවේක කාමර පහසුකම් හා සනීපාරක්ෂක සේවා වැඩි දියුණු කිරීම.
    - ➢ ජංගම දුරකථන මගින් ආසන වෙන් කිරීම තවදුරටත් පුළුල් කිරීම.
    - ➢ ඩිජිටල් කාලසටහන් දුම්රිය ස්ථානවල ස්ථාපිත කිරීම
- මගී පහසුකම් තවදුරටත් දියුණු කිරීම සඳහා මිල්කෝ, කෝප්‍රෙඩ් වැනි ආයතන සමඟ දුම්රිය ස්ථාන පරිශ්‍රයන්හි අලෙවිසැල් පිහිටුවීමට මූලික කටයුතු තව දුරටත් ක්‍රියාත්මක කිරීම.
- විනාශව තිබූ යාපනය දුම්රිය ස්ථානය ලංකා බැංකුවේ මූල්‍ය ප්‍රතිපාදන මත නැවත ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීම.
- ප්‍රවේශපත් නොමැතිව දුම්රියේ ගමන් කරන මගීන්ගෙන් දඩ මුදල් අය කර ගැනීමේ කටයුතු අඛණ්ඩව සිදු කිරීම.
- පොදු රාජ්‍ය මණ්ඩලීය නායක සමුළුවට සමගාමීව කොළඹ කොටුව හා මරදාන දුම්රිය ස්ථාන නවීකරණය කිරීම.

උතුරු දුම්රිය මාර්ගයේ නැවත ඉදි කිරීමේ ව්‍යාපෘති වල වර්තමාන ප්‍රගතිය පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තුගත වියදම (ඇ.ඩො.මි.) | අපේක්ෂිත භෞතික ඉලක්කය (දුර කි.මී.) | ප්‍රගතිය (%) | |
|---|---|---|---|---|
| | | | ප්‍රගතිය (%) | භෞතික |
| මැදවච්චිය සිට මඩු දක්වා දුම්රිය මාර්ගය නැවත ඉදි කිරීම | 81.30 | 43 | අවසන් කර ඇත. | |
| මඩු සිට තලෙයිමන්නාරම දක්වා දුම්රිය මාර්ගය නැවත ඉදි කිරීම | 149.50 | 63 | 75% | 65% |
| ඕමන්තේ සිට පලෙයි දක්වා දුම්රිය මාර්ගය නැවත ඉදි කිරීම | 185.49 | 91 | 90% | 97% |
| පලෙයි සිට කන්කසන්තුරේ දක්වා දුම්රිය මාර්ගය නැවත ඉදි කිරීම | 149.34 | 56 | 41% | 40% |
| උතුරු දුම්රිය මාර්ගය සඳහා සංඥා හා විදුලි සංදේශ පද්ධතිය ස්ථාපනය කිරීම | 86.50 | 313 | 50% | 43% |

## 1.2 මෙහෙයුම් දර්ශක

| දර්ශකය | 2012 (මිලියන) | 2013 (මිලියන) |
|---|---|---|
| දුම්රිය කි.මී. | 10.36 | 10.49 |
| මඟී දුම්රිය කි.මී. | 9.35 | 9.93 |
| භාණ්ඩ දුම්රිය කි.මී | 0.52 | 0.56 |
| මඟී සංඛ්‍යාව | 106.04 | 118.71 |
| මඟී කි.මී. | 5039.44 | 6257.37 |
| භාණ්ඩ කි.මී. | 143.41 | 132.45 |
| භාණ්ඩ ටොන් | 2.06 | 1.91 |

## 1.3 යටිතල පහසුකම් සංවර්ධනය

### 1.3.1 දුම්රිය මාර්ග

ශ්‍රී ලංකාවේ මුළු දුම්රිය මාර්ගය කි.මී. 1640 ක් පමණ වන අතර මේ වන විට කි.මී. 1447 ක් දුම්රිය ධාවනය සඳහා යොදා ගැනේ. යුද්ධය නිසා විනාශ වූ උතුරු සහ තලෙයිමන්නාරම දුම්රිය මාර්ග මේ වන විට නැවත ඉදි වෙමින් පවතින අතර තලෙයිමන්නාරම දුම්රිය මාර්ගයේ මැදවච්චියේ සිට මඩු දක්වාත් උතුරු දුම්රිය මාර්ගයේ කිලිනොච්චිය දක්වාත් මේ වන විට ඉදි කිරීම් කටයුතු අවසන් වී ඇති අතර දුම්රිය ධාවන කටයුතු සිදු කෙරේ. ස්ථිර මාර්ග ජාලයේ, සංඥා පද්ධතියේ හා දුම්රිය ඇණියේ නඩත්තු කටයුතු ද නොකඩවා සිදු කරමින් පවතී. තවද කොළඹ - රාගම තුන්වැනි මාර්ගය ධාවන කටයුතු සඳහා විවෘත කිරීම හා ජා ඇල - සීදුව මාර්ගය ද්විත්ව මාර්ගයක් බවට පත් කිරීම මෙම වර්ෂයේදී සිදු කරන ලදි. මහනුවර - පේරාදෙණිය මාර්ගය ද්විත්ව දුම්රිය මාර්ගයක් බවට පත්කිරීමේ කටයුතු අරඹා ඇති අතර දකුණු කළුතර සිට දකුණු පයාගල දක්වා දුම්රිය මාර්ගය ද්විත්ව දුම්රිය මාර්ග බවට පත් කිරීම සඳහා මාර්ග සැලසුම් කටයුතු නිම කර ඇත.

**1. මැදවච්චිය සිට තලෙයිමන්නාරම දක්වා දුම්රිය මාර්ගය නැවත ඉදි කිරීම**

ඉන්දියානු ණය ආධාර යටතේ ඉදි වන මෙම ව්‍යාපෘතිය අදියර 02 ක් යටතේ සිදු වන අතර මැදවච්චියේ සිට මඩු දක්වා කි.මි. 43ක දුම්රිය මාර්ගය නැවත ඉදිකර ධාවන කටයුතු සඳහා යොදවා ඇත. මඩු සිට තලෙයිමන්නාරම දක්වාත් ඉදි කිරීම් කටයුතු සිදු වේ. මේ සඳහා ඇස්තමේන්තු කොට ඇති මුළු මුදල ඇ.ඩො.මි. 231 ක් වේ.

**2. ඕමන්තේ සිට පලෙයි දක්වා දුම්රිය මාර්ගය නැවත ඉදි කිරීම**

උතුරු දුම්රිය මාර්ගය නැවත ඉදි කිරීමේ ව්‍යාපෘතිය යටතේ ඉදි වන මෙහි ඇස්තමේන්තුගත මුළු වියදම ඇ.ඩො.මි. 185.49 ක් පමණ වේ. මෙම මාර්ගය මේ වන විට කිලිනොච්චිය දක්වා ඉදි කිරීම් කටයුතු අවසන් කර දුම්රිය ධාවනය සඳහා යොදා ගෙන ඇත.

**3. පලෙයි සිට කන්කසන්තුරේ දක්වා දුම්රිය මාර්ගය නැවත ඉදි කිරීම**

මෙම දුම්රිය මාර්ගයේ දුර කි.මී. 56 ක් වන අතර ඒ සඳහා ඇස්තමේන්තු කොට ඇති මුදල ඇ.ඩො.මි. 149.34 කි. මේ වන විට මෙහි ඉදි කිරීම් කටයුතු සිදු වෙමින් පවතින අතර 2014 වන විට ඉදි කිරීම් කටයුතු නිම කොට සේවය සඳහා යෙදවීමට අපේක්ෂිතය.

4. **අනුරාධපුරයේ සිට උතුරු දුම්රිය මාර්ගය සහ තලෙයිමන්නාරම දුම්රිය මාර්ගය සඳහා නව සංඥා හා විදුලි සංදේශ පද්ධතියක් ස්ථාපිත කිරීම**

උතුරු දුම්රිය මාර්ගය නැවත ඉදි කිරීමේදී ඒ සඳහා අවශ්‍ය විදුලි සංදේශ පද්ධතිය ස්ථාපනය කිරීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කෙරේ. මේ සඳහා ඇස්තමේන්තු කළ වියදම ඇ.ඩො.මි. 86.5 ක් පමණ වේ.

### 1.3.2 සංඥා හා විදුලි සංදේශ පද්ධතිය

දුම්රිය සේවාව කාර්යක්ෂම කිරීමේ දී සංඥා සහ විදුලි සංදේශ පද්ධතිය විශාල දායකත්වයක් ලබා දෙයි. සංඥා දෝෂ අවම මට්ටමක පවත්වා ගෙන යමින් දුම්රිය සේවය නිසි අයුරින් පවත්වා ගෙන යෑමට මෙය ඉතා වැදගත් වේ. මේ යටතේ සංවර්ධන කාර්යයන් කීපයක් ක්‍රියාත්මක වන අතර උතුරු දුම්රිය මාර්ගය සඳහා විදුලි සංඥා පද්ධතිය ස්ථාපිත කිරීම පවතින සංඥා දෝෂ නඩත්තු කිරීම, ආරක්ෂිත දුම්රිය හරස් මාර්ග ඉදි කිරීම ආදිය ඒ අතර වේ.

### 1.3.3 දුම්රිය ඇණිය

පවතින දුම්රිය ඇණිය සඳහා චීනයෙන් ගෙන්වන ලද නව බලවේග කට්ටල 13ක් එකතු වූ අතර ඒ සියළු බලවේග කට්ටල ධාවනය සඳහා යොදා ගැනුණි. මගී මැදිරි 15 ක් හා එංජින් 03 ක් පුනරුත්ථාපනය කර දුම්රිය ඇණියට එකතු කොට ඇත. තවද සේවය සඳහා දුම්රිය එංජින් සාමාන්‍ය දෛනික භාවිතය 60% මට්ටමේ පවත්වා ගෙන යාමට හැකි විය.

චීනයෙන් නව බලවේග කට්ටල 13 ක් ආනයනය කිරීමත් සමඟ එතෙක් කෙටි දුර ධාවනය සඳහා යොදා ගත් බලවේග කට්ටල දුර ගමන් සේවා සඳහා ධාවනයට එක් කෙරිණි. විශේෂයෙන්ම උඩරට දුම්රිය මාර්ගය සඳහා මෙම බලවේග කට්ටල ධාවනය කිරීම ආරම්භ වීමත් සමඟ එම මාර්ගයේ දුම්රිය ධාවනය ඉහළ ගියේය. එය උඩරට දුම්රිය මාර්ගයේ බදුල්ල සහ මහනුවර දක්වා දුම්රිය ධාවනයේ ගුණාත්මක බව වර්ධනය කිරීමට ඉවහල් විය. මේ යටතේ එම මාර්ගය සඳහා සම්පූර්ණයෙන් වායුසමනය කළ දුම්රිය ලබා දීමට හැකි විය. එමෙන්ම කාර්යාල දුම්රිය සඳහා ද්විත්ව බලවේග කට්ටල ලබා දීම තුළින් මගී ජනතාවට වඩාත් පහසු දුම්රිය සේවාවක් ලබා දීමට කටයුතු කරන ලදි.

## 1.4 මූල්‍ය ප්‍රගතිය

| ආදායම /වියදම (රු.මි) | 2012 | 2013 |
|---|---|---|
| සාමාන්‍ය ප්‍රවේශපත් | 2806.01 | 3557.21 |
| වාර ප්‍රවේශපත් | 793.44 | 930.44 |
| පාර්සල් හා ලිපි | 119.62 | 134.5 |
| භාණ්ඩ හා පශු සම්පත් | 461.84 | 412.5 |
| වෙනත් | 670.93 | 388.64 |
| **එකතුව** | **4851.87** | **5423.29** |
| **වියදම** | | |
| පුණරාවර්තන වියදම (රු.මි.) | 8647.65 | 10586.47 |
| ප්‍රාග්ධන වියදම (රු.මි.) | 30077.21 | 20248.99 |
| මුළු වියදම | 38724.86 | 30835.46 |

# 2. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

## 2.1 පසුබිම

ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි නොකළ මෝටර් වාහන ලියාපදිංචි කිරීම සඳහා, 1928 ජනවාරි මස 01 වන දින මෝටර් වාහන රෙජිස්ට්‍රාර් කාර්යාලය ආරම්භ කරන ලද අතර එය 1951 අංක 14 දරණ මෝටර් වාහන පනත මගින් මෝටර් වාහන රෙජිස්ට්‍රාර් කාර්යාලය දෙපාර්තමේන්තුවක් ලෙස පරිවර්තනය කරන ලදි.

**දැක්ම**

''විශිෂ්ට මෝටර් වාහන නියාමනයෙන් ඉහළ මහජන ප්‍රසාදය''

**අපේ මෙහෙවර**

''අභිප්‍රේරණය වූ සේවක සමූහයේ සාමූහික ප්‍රයත්නය හා නවීන තාක්ෂණය යොදා ගනිමින් මෝටර් වාහන පනත හා අනෙකුත් නීති රෙගුලාසි ප්‍රශස්ථ ලෙස ක්‍රියාත්මක කිරීමෙන් ඉහළ මහජන ප්‍රසාදයක් උදෙසා කැපවීම.''

## 2.2 මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කාර්යයන්

1. ධාවනය කළ හැකි මෝටර් වාහන නව ලියාපදිංචිය
2. වාහන හිමිකම් පැවරීම ලියාපදිංචි කිරීම
3. රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ සේවාව
4. මෝටර් වාහන සම්බන්ධ කාර්මික සේවාව
5. වායු විමෝචන තත්ත්වය නියාමන කාර්යය (පරිසරය සුරැකීමේ අරමුණින්)
6. මාර්ග ආරක්ෂාව පිළිබඳ කාර්යයන්

## 2.3 කාර්ය සාධනය (2013 ජනවාරි - දෙසැම්බර් 31)

දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබන කාර්යයන් ගේ ප්‍රගතිය පියවරයන් 3ක් ඔස්සේ පහත ලෙස සමාලෝචනය කළ හැක.

1. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය
2. ප්‍රාග්ධන ව්‍යාපෘති වල ප්‍රගතිය
3. මහජන සේවාවන් වල සංඛ්‍යාත්මක ප්‍රගතිය

දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය වඩා සක්‍රීය හා ඵලදායි කිරීම සඳහා අවශ්‍ය පහසුකම් දෙපාර්තමේන්තුව තුළින් සපයා දීමට අවශ්‍ය කටයුතු සලසා ඇත.

### 1. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය

සංයුක්ත සැලැස්මට සමගාමීව ක්‍රියාත්මක වනු ලබන වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම තුල අන්තර් ගත වන ක්‍රියාකාරකම් අරමුණු කර ගත් කාලය තුල ක්‍රියාත්මක කිරීම අත්‍යාවශ්‍ය වන අතර 2013 වසර තුල යෝජිත ක්‍රියාකාරකම් මේ වන විට සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී.

### I. වර්ණ නීති ක්‍රමය

ශ්‍රී ලංකාව තුල පොදු මගී ප්‍රවාහනය සිදු කරනු ලබන වාහන හා පාසල් සේවයේ යොදවනු ලබන වාහන සමස්ථය නිශ්චිත වර්ණයකට අනුකූලව 2013 ජනවාරි 31 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි වර්ණ ගැන්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

නිකුත් කරන ලද ගැසට් නිවේදනයට අනුකූලව පොදු මගී ප්‍රවාහනයේ යොදවනු ලබන ලංකා ගමනා ගමන මණ්ඩලයට අදාල බස් රථ රතු පැහැයෙන් ද පෞද්ගලික ප්‍රවාහන සේවයේ යෙදෙන බස් රථ ලා නිල් පැහැයෙන් ද වර්ණ ගැන්වීමට නියමිත අතර පාසල් ප්‍රවාහන සේවයේ යොදවනු ලබන වාහන කහ පැහැති වර්ණයෙන් වර්ණ ගැන්වීමට පියවර ගනු ලැබීය.

### II. Dash Board System

මහජනතාවට වැදගත් විය හැකි දෙපාර්තමේන්තුවේ තොරතුරු ශ්‍රව්‍ය දෘශ්‍ය ආකාරයෙන් දෙපාර්තමේන්තු පරිශ්‍රය තුල ප්‍රදර්ශනය කිරීම සහ කළමනාකරණයට වැදගත් වන තොරතුරු දෙපාර්තමේන්තු නිළධාරීන් වෙත ලබාදීම සඳහා පිවිසුමක් ඇති කිරීම මේ මගින් සිදු කරයි.

(උදා : දෛනික කාර්යය සාධන දත්ත පරීක්ෂා කිරීම හා ලැබුණු අයදුම්පත් වල ප්‍රගතිය පරීක්ෂා කිරීම)

### III. රියදුරු අභිවෘද්ධි ලකුණු ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

ශ්‍රී ලංකාව තුල ධාවනයවන වාහන පද්ධතිය හා මාර්ග ආරක්ෂාව පිළිබඳ ගැටළු රාශියක් පවතින අතර එම ගැටළු අවම කර ගැනීම සඳහා සහ විනයානුකූල රියදුරන් බිහි කිරීම සඳහාත් මෙම රියදුරු අභිවෘද්ධි ලකුණු ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය  කටයුතු 2011 අංක 3 දරණ මෝටර් වාහන පනතට අනුකූලව ක්‍රියාත්මක කරන ලදි.

රියදුරු අභිවෘද්ධි ලකුණු ක්‍රමය දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට යෝජිත වුවත් නියමු ව්‍යාපෘතිය කොළඹ නගරය කේන්ද්‍ර කර ගනිමින් ක්‍රියාත්මක වේ. මේ වන විට

- බීමත්ව රිය පැදවීම.
- මාරක රිය අනතුරු

යන වැරදි ද්විත්වය පාදක කරගෙන තොරතුරු රැස් කරමින් පවතී. මේ වන විට වාර්තාගත වී ඇති තොරතුරු 15,677 ක් පමණ හඳුනා ගෙන ඇති අතර 2013 වසරේ ඔක්තෝබර් මාසය දක්වා හඳුනාගනු ලැබූ තොරතුරු මේ යටතට අයත් වේ.

### IV. ඊ - මෝටරින් ව්‍යාපෘතිය

ICTA වර්තාව අනුව ක්‍රියාත්මක කරනු ලබන මෙම ව්‍යාපෘතිය මේ වන විට අදියර කිහිපයක් ඔස්සේ ක්‍රියාත්මක වන අතර BOT ක්‍රමය මත පදනම්ව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි.

දෙපාර්තමේන්තුව තුල සේවා සැපයීමේ දී භාවිතා වන ලිපිගොනු වල ආරක්ෂාව තහවුරු කිරීමටත් අදාල දෙපාර්තමේන්තුවට කාර්යයන් පහසු කිරීමටත් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යෝජනා වූ අතර මේ තුලින් දෙපාර්තමේන්තුවේ කාර්යයන්ගෙන් බොහෝමයක් ආවරණ වේ. දෙපාර්තමේන්තුව තුළ භාවිතා කරනු ලබන ලිපිගොනු පරිලෝකනය කර (scan) පරිගණක ගත කිරීම මේ තුලින් කරනු ලබන අතර දෙපාර්තමේන්තුවට අවශ්‍ය වන ලිපිගොනු වල ආරක්ෂාව මෙමඟින් තහවුරු වන අතර ලිපිගොනු ගබඩා කිරීමට අවශ්‍ය ඉඩ කඩ අවම කර ගත හැක.

2. අයවැය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරනු ලබන ප්‍රාග්ධන ව්‍යාපෘති වල ප්‍රගතිය

දෙපාර්තමේන්තුව තුළ ප්‍රාග්ධන ව්‍යාපෘතීන් කාණ්ඩ කිහිපයක් ඔස්සේ ක්‍රියාත්මක වනු ලබන අතර මේ යටතේ ප්‍රධාන වශයෙන්,

- ප්‍රධාන කාර්යාලය, වේරහැර උප කාර්යාලයේ ඉදි කිරීම් කටයුතු
- දිස්ත්‍රික් කාර්යාල වල ඉදි කිරීම් කටයුතු
- යන්ත්‍රෝපකරණ මිල දී ගැනීම
- මානව සම්පත් කළමනාකරණය සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ප්‍රධාන කාර්යාලය තුළ ඉදි කිරීම් ව්‍යාපෘති කිහිපයක් 2013 වර්ෂය තුළ ක්‍රියාත්මක වෙමින් පවතී. 2013 ආරම්භයේ ත්‍රීවිල් නව ලියාපදිංචි ශාඛාවේ හා භෝජනාගාරයේ වැඩ අවසන් වූ අතර මේ වන විට මහජන ගැලරිය නවීකරණ කටයුතු හා ත්‍රීවිල් නව ලියාපදිංචි අංශය සඳහා ගබඩා පරිශ්‍රයක් ද මෝටර් කාර් පැවරුම් අංශය තුළ නවීකරණ කටයුතු සිදු කිරීමට කටයුතු කරමින් පවතී.

ඊට අමතරව දෙපාර්තමේන්තුව තුළින් ලබා දෙන සේවාවන් පුළුල් කරමින් දීප ව්‍යාප්තව ලබා දීම උදෙසා දිස්ත්‍රික් කාර්යාල ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී. එහි පියවරයන් ලෙස අනුරාධපුර, කෑගල්ල, මඩකලපුව, කළුතර, පුත්තලම, ගම්පහ, කුරුණෑගල හා නුවර එළිය යන දිස්ත්‍රික් කාර්යාල වල ඉදි කිරීම් කටයුතු නිම කර ඇත. 2013 වසර තුළ යාපනයේ දිස්ත්‍රික් කාර්යාලයේ ඉදි කිරීම් කටයුතු මෙන්ම අනුරාධපුර අංක තහඩු ගබඩා කිරීමට ගොඩනැගිල්ලක් ද ඉදි කිරීමට කටයුතු කරමින් පවතී. මීට අමතරව කළුතර, පොළොන්නරුව වැනි දිස්ත්‍රික් කාර්යාල ගණනාවක අභ්‍යන්තර පිරිසැකසුම් කටයුතු නිම කර ඇත.

3. මහජන සේවාවන් වල සංඛ්‍යාත්මක ප්‍රගතිය

- **මෝටර් වාහන සම්බන්ධව කාර්මික සේවාව**

| | කාර්යය | ප්‍රමාණය - 2013 |
|---|---|---|
| 1 | රියදුරු බලපත්‍ර ලබා ගැනීමේ ලිඛිත පරීක්ෂණ පැවැත්වීම | 145,268 |
| 2 | රියදුරු බලපත්‍ර ලබා ගැනීමේ ප්‍රායෝගික පරීක්ෂණ | 450,495 |
| 3 | අංක තහඩු නිකුත් කිරීම (කොළඹ) | 433,633 |
| 4 | අංක තහඩු නිකුත් කිරීම (පිට පළාත්) | |
| 5 | ගරාජ, නව වෙළඳ ආයතන ලියාපදිංචි කිරීම | 67 |
| 6 | ගරාජ, නව වෙළඳ ආයතන අළුත් කිරීම | 721 |
| 7 | රියදුරු පාසල් පරීක්ෂා කිරීම | 39 |
| 8 | මූලාකෘති නිකුත් කිරීම | 254 |
| 9 | C.M.T. වැසි අංක නිකුත් කිරීම | 10 |
| 10 | ට්‍රේලර් වැසි අංක නිකුත් කිරීම | 2,534 |
| 11 | රේගු වෙන්දේසි වාහන සඳහා C.M.T. වැසි අංක නිකුත් කිරීම | 103 |
| 12 | යතුරුපැදි පරීක්ෂා කිරීම | 2,414 |
| 13 | නව යතුරුපැදි පරිගණක ගත කිරීම | 171,863 |
| 14 | බර සහතික නිකුත් කිරීම | 12,867 |
| 15 | අනන්‍යතා සහතික නිකුත් කිරීම | 2,167 |
| 16 | තහනම් නියෝග නිකුත් කිරීම | 2,267 |
| 17 | තහනම් නියෝග ඉවත් කිරීම | 2,092 |
| 18 | රිය අනතුරු පරීක්ෂා කිරීම | 5,040 |
| 19 | විශේෂ රාජකාරී සඳහා සහභාගී වීම | 427 |

4. වායු විමෝචන පරීක්ෂණ කාර්යයන් නියාමනය කිරීම.

ලියාපදිංචි වන අධික වාහන ප්‍රමාණය හේතුවෙන් නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශ තුළ ඇති වන වායු දූෂණය අවම කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන වායු විමෝචන නියාමන වැඩසටහන් තව දුරටත් සවිබල ගන්වන ලදී. ඒ යටතේ ජංගම වායු විමෝචන පරීක්ෂණ ඒකකයක් ඇති කරන ලද අතර දිස්ත්‍රික් මට්ටමේදී ද මෙබඳු පරීක්ෂණ ඒකකයන් පිහිටුවා ඇත. සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි උතුරු පළාත තුලද 2013 ජුලි 01 වන දින වායු විමෝචන පරීක්ෂණ ඒකකයන් ස්ථාපිත කල අතර ක්ලීන්කෝ ලංකා පුද්ගලික සමාගම යටතේ මධ්‍යස්ථාන 17ක් ද ලාෆ් ඉකෝ ශ්‍රී පුද්ගලික සමාගම යටතේ මධ්‍යස්ථාන 09ක් ද යාපනය දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක වේ. වායු විමෝචන නියාමන වැඩසටහන් යටතේ මේ වන විට පරීක්ෂා කරනු ලබන වාහනයේ ලියාපදිංචි පළාතට පමණක් සීමාවීමකින් තොරව දිවයින තුල කුමන හෝ මධ්‍යස්ථානයකින් අදාල පරීක්ෂාවන් කර ගැනීමට පහසුකම් සපයා ඇත.

**2013 වසර සඳහා ඇස්තමේන්තු කල ආදායම හා තත්‍ය ආදායම.**
**(ජනවාරි - දෙසැම්බර්)**
**ආදායම**

| **ආදායම් විස්තරය/ ආදායම් ශීර්ෂය** | **2013.12.31 දිනට ඇස්තමේන්තුගත ආදායම රු.මි.** | **2013.12.31 දිනට තත්‍ය ආදායම රු.මි.** |
|---|---|---|
| | | |
| සුඛෝපභෝගී මෝටර් වාහන බද්ද | 1,350.00 | 1,146.01 |
| මෝටර් වාහන විකිණීම මත බදු | 42.03 | 55.61 |
| මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ බදු අයකරනු ලබන ගාස්තු | 6,800.00 | 6,530.61 |
| **මුළු ආදායම** | **8,192.03** | **7,732.24** |

මූලාශ්‍රය: මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

දෙපාර්තමේන්තුව ඉපයු සමස්ථ ආදායම සලකා බැලීමේ දී මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ අයකරනු ලබන බදු මඟින් ලබා ගන්නා ලද ආදායම 84% ක් වැනි ඉහල අගයක් ගෙන ඇති අතර මෝටර් වාහන විකිණීම මත අය කරනු ලැබූ බදු වල වැදගත්කම සමස්ථ බදු වටිනාකමින් 1% ක් වැනි පහළ අගයක් පෙන්නුම් කරනු ලැබේ.

**වියදම**

| **වියදම් විස්තරය / වියදම් ශීර්ෂය** | **2013.12.31 දිනට ඇස්තමේන්තුගත වියදම රු.මි.** | **2013.12.31 දිනට ඇස්තමේන්තුගත වියදම රු.මි.** |
|---|---|---|
| පුනරාවර්ථන වියදම | 1,448.30 | 1,266.37 |
| ප්‍රාග්ධන වියදම | 1,050.80 | 928.06 |
| **මුළු වියදම** | **2,499.10** | **2,194.44** |

මූලාශ්‍රය: මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

# 3. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

ශ්‍රී ලංකාවේ මගී ප්‍රවාහන සේවාව තුල රාජ්‍ය අංශයේ දායකත්වය ප්‍රමුඛව ලබා දෙන ආයතනය වන ශ්‍රී ලංගම වසරේ සෑම දිනකම ජනතාවට සේවය කරනු ලබන රාජ්‍ය ආයතන අතර ප්‍රමුඛ ස්ථානයක් ගනී.

**දැක්ම**

කලාපයේ විශිෂ්ඨතම මගී ප්‍රවාහකයා.

**මෙහෙවර**

මහජනතාවට ආරක්ෂිත, විශ්වාසදායි, සුවපහසු මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවයක් සාධාරණ ගාස්තු ක්‍රමයක් යටතේ සේවයට කැපවූ ඵලදායී කාර්ය මණ්ඩලයක් මගින් ආයතනයේ සියලුම සම්පත් උපරිම ප්‍රයෝජනයට ගනිමින් ආර්ථිකමය වශයෙන් තුලනාත්මකව පවත්වාගෙන යාම.

## 3.1 සමාජ ප්‍රතිලාභ සඳහා ශ්‍රී ලංගම දායකත්වය

- **අලුයම ප්‍රථම හා රාත්‍රී අවසන් ගමන් වාර ධාවනය.**

ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයක්ම ආවරණය වන පරිදි අලුයම ප්‍රථම හා රාත්‍රී අවසන් ගමන් වාර සැපයීම තුලින් රටේ ආර්ථිකයට දායකවන ශ්‍රම බලකායේ ප්‍රවාහන අවශ්‍යතා සැපයීමේ නිරත වූවත් මෙම සේවාව තුලින් ශ්‍රී ලංගමයට අතීතයේ සිට හිමිව ඇති ලාභයක් නොමැති තරම් වේ. නමුත් ශ්‍රී ලංගම සමාජයීය වගකීමක් ලෙස සලකා මෙම සේවාව සැපයීම සිදුවේ.

- **ග්‍රාමීය සේවා බස්රථ ධාවනය**

ග්‍රාමීය ආර්ථිකය ඉහල නැංවීම සඳහා නගරය හා යා කිරීමට ශ්‍රී ලංගමය මගින් දක්වන දායකත්වය විදහාපාමින් අනාර්ථික මාර්ග ධාවනය මගින් ඇති වන අලාභදායි තත්ත්වයන් පිළිබඳ නොසලකා මෙම සේවාව සැපයීමට ශ්‍රී ලංගම ක්‍රියාකරනු ලබයි.

- **පාසැල් සේවා බස්රථ ධාවනය**

ශ්‍රී ලංගම මගින් දරන බරපැන තුලින් දැයේ හෙට දිනය වෙනුවෙන් සමාජ ප්‍රතිලාභ ඇති කිරීමට කටයුතු කරනු ලබයි. ඒ අනුව මගී තදබදය අධික සහ ලාභ ඉපයීම සිදුකර ගත හැකි අවස්ථා රැසක් අහිමි කරගනිමින් වුවද අප සතුව ඇති සීමිත රථ ඇණිය තුල වැඩි ඉඩකඩක් අනාගත පරපුරට නොපමාව පාසලට ගෙන යාමේ ජාතික මෙහෙවරට යොමුව ඇත.

- **ජාතික උත්සව අවස්ථාවල සිදුකරනු ලබන බස්රථ ධාවනය**

සිංහල හින්දු අලුත් අවුරුදු උත්සවය, වෙසක් හා පොසොන් උත්සවය, මහනුවර හා කතරගම ඇසල පෙරහැර උත්සවය, වාර්ෂික මඩු හා තලවිල මංගල්‍යය, ශ්‍රීපාද සේවය වැනි සේවා ශ්‍රී ලංගම මගින් සමාජ සත්කාරක සේවයන් ලෙස ක්‍රියාත්මක කරයි.

- **වාර ප්‍රවේශ පත්‍ර සේවා**

පාසල්, විශ්ව විද්‍යාල හා වැඩිහිටි වශයෙන් වෙන් කරමින් විවිධ මට්ටම් තුලින් ප්‍රවාහන අවශ්‍යතා ලබා දීමට ශ්‍රී ලංගම ගෙන ඇති ක්‍රියාමාර්ග මඟින් රටේ සිටින මගී ජනතාවට ආර්ථික වශයෙන් සහන සැළසීම සිදු කරයි.

### 3.2 බස් රථ ධාවනය තුලින් ලබා ගෙන ඇති ප්‍රගතිය

- මහින්ද චින්තන ප්‍රතිපත්තියට අනුව යමින් ආබාධිත පුද්ගලයන්ට ගමන්කිරීමේ පහසුකම් සහිත බස් රථ ධාවනයට එක්කිරීමේ ආරම්භක පියවරක් වශයෙන් (Low Floor) බස් රථ 13 ක් කොළඹ නගරය ආශ්‍රිතව 2012 වර්ෂයේ සිට ආරම්භ කල අතර එය 2013 වසරේදීත් අඛණ්ඩව ධාවනය කෙරේ.

| ආබාධිත පුද්ගලයන්ටද ගමන් කිරීමේ පහසුකම් සහිතව කොළඹට ඇතුළු වන මාර්ග ආවරණය වන පරිදි යොදා ඇති සුඛෝපභෝගි බස්රථ ධාවනය වන මාර්ග |
|---|

  - ➢ බම්බලපිටිය - කඩවත
  - ➢ මොරටුව - කොළඹ
  - ➢ හෝමාගම - කොළඹ
  - ➢ පානදුර - කොළඹ
  - ➢ මීගමුව - කොළඹ - පානදුර
  - ➢ කිරිබත්ගොඩ - මොරටුව
  - ➢ මහරගම - කොළඹ

- ශ්‍රී ලංගම මඟින් දකුණු අධිවේගී මාර්ගය සහ වෙනත් දුර සේවා සඳහා අධි සුඛෝපභෝගි බස්රථ 25 ක් යොදා ගනිමින් මගී ප්‍රවාහන අවශ්‍යතා ශක්තිමත් කර ඇත. මෙයින් බස්රථ 05 ක් (Low Floor) ආබාධිත පුද්ගලයන්ගේ ගමන් පහසුකම් සහිතව ධාවනයට එක්කර ඇත.

- ත්‍රෛයි භාෂාවෙන් ඉලෙක්ට්‍රොනික් ඩිජිටල් නාම පුවරු සවිකිරීම මඟින් රජයේ භාෂා ප්‍රතිපත්තිය තහවුරු කිරීමට ශ්‍රී ලංගම ක්‍රියා කරමින් සිටී. ඒ යටතේ දුර ගමන් සේවා බස් රථ 50 ක් දැනටමත් ක්‍රියාත්මක වේ. මෙය 2014 වර්ෂයේදී සම්පූර්ණයෙන්ම නිම කිරීමට බලාපොරොත්තු වන ව්‍යාපෘතියකි.

- බස්නාහිර පලාත තුල ඇති සියළු ශ්‍රී ලංගම බස්රථ සඳහා ඉලෙක්ට්‍රොනික ටිකට් යන්ත්‍ර භාවිතයට යෙදවීම සාර්ථකව සිදුකර ඇත. තවද දකුණ, වයඹ, සබරගමුව යන ප්‍රාදේශික තුලද මෙම සේවාව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත. මෙයද 2014 වර්ෂයේදී සම්පූර්ණයෙන්ම නිම කිරීමට බලාපොරොත්තු වේ.

- මහින්ද චින්තන ප්‍රතිපත්තියේ සඳහන් පරිදි ඉලෙක්ට්‍රොනික කාඩ් භාවිතයෙන් ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ ආරම්භක පියවර වශයෙන් බස්නාහිර පළාතේ පාසල් 03 ක සිසුන් සඳහා විද්‍යුත් වාර ප්‍රවේශපත්‍ර භාවිතයට යෙදවීම සිදුකර ඇත. මෙම ව්‍යාපෘතිය 2013 වර්ෂය ඇතුලත කොළඹ දිස්ත්‍රික්කය තුල නිම කිරීමට බලාපොරොත්තු ඇතිව ආරම්භ කරනු ලැබුවකි.

- ශ්‍රී ලංගම මගින් දකුණු අධිවේගී මාර්ගය තුල අධි සුඛෝපභෝගි බස්රථ යොදා ගනිමින් මගී ප්‍රවාහන සේවා ආරම්භයේදී පැවති තත්ත්වයට වඩා තවදුරටත් ව්‍යාප්ත කර ඇති අතර වර්තමානය වන විට පහත ප්‍රදේශ ආවරණය කරමින් අඛණ්ඩව කටයුතු පවත්වාගෙන යනු ලැබේ.

**සුඛෝපභෝගී බස්රථ යොදාගනිමින් දකුණු අධිවේගී මාර්ගය හරහා සිදුකරන සේවා පිළිබඳ විස්තර**

- ➢ මහරගම - ගාල්ල
- ➢ ඇල්පිටිය - මහරගම
- ➢ කොළඹ - මත්තල ගුවන්තොටුපල
- ➢ පිටකොටුව - ගාල්ල (රාජගිරිය, බත්තරමුල්ල හරහා)
- ➢ මතුගම - කොළඹ
- ➢ කුරුණෑගල කටුනායක හරහා කොළඹ
- ➢ කටුනායක - කොළඹ
- ➢ මීගමුව - කොළඹ

- ■ කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල හා මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල අතර බස්රථ සේවාවක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කල අතර පිටකොටුව හා මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල අතර සුඛෝපභෝගී බස් සේවයක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදි.

- ■ සිසුසැරිය බස් සේවාව යටතේ බස්රථ 619 ක් ධාවනයට එක් කර ඇති අතර, දිවයින පුරා එහි ව්‍යාප්තිය පහත පරිදි වේ.

**සිසු සැරිය පාසල් බස්රථ සේවා ව්‍යාප්තිය**

| ප්‍රාදේශිකය | වර්තමානයේ ධාවනයට යොදවා ඇති බස් රථ සංඛ්‍යාව | ඉදිරියේදී යෙදවීමට යෝජිත නව බස්රථ | ධාවනයට අපේක්ෂිත මුළු බස්රථ ප්‍රමාණය |
|---|---|---|---|
| කොළඹ | 103 | 43 | 146 |
| ගම්පහ | 55 | 24 | 79 |
| කළුතර | 33 | 14 | 47 |
| නුවරඑළිය | 4 | 12 | 16 |
| මහනුවර | 26 | 20 | 46 |
| නැගෙනහිර | 35 | 5 | 40 |
| රුහුණ | 78 | 23 | 101 |
| සබරගමුව | 101 | 22 | 123 |
| ඌව | 51 | 9 | 60 |
| උතුර | 25 | 0 | 25 |
| රජරට | 69 | 12 | 81 |
| වයඹ | 39 | 25 | 64 |
| **එකතුව** | **619** | **209** | **828** |

- ■ 2012 හා 2013 වර්ෂවල ජනවාරි සිට ජුනි දක්වා මාර්ගලේඛන ආදායම සැලකීමේදී 2013 වර්ෂයේ එහි වර්ධනයක් දැකිය හැකි නමුත් 2012 හා 2013 ජනවාරි පෙබරවාරි මාසවල ඉන්ධන මිළ හා ගාස්තු සංශෝධන සිදුවූ බැවින් එම මාස අතහැර අනිකුත් මාස සැලකීමේදී ආසන්න වශයෙන් 5% පමණ මාර්ගලේඛන ආදායමෙහි වර්ධනයක් දැකගත හැකිවී ඇත.

| 2012 හා 2013 වර්ෂ වල මාර්ග ලේඛන ආදායම් | | |
|---|---|---|
| **මාසය** | **2012 රු.මි.** | **2013 රු.මි.** |
| ජනවාරි | 1,360 | 1,589 |
| පෙබරවාරි | 1,434 | 1,456 |
| මාර්තු | 1,428 | 1,627 |
| අප්‍රේල් | 1,505 | 1,581 |
| මැයි | 1,486 | 1,561 |
| ජුනි | 1,577 | 1,563 |
| ජුලි | 1,613 | 1,661 |
| අගෝස්තු | 1,650 | 1,732 |
| සැප්තැම්බර් | 1,541 | 1,594 |
| ඔක්තෝම්බර් | 1,558 | 1,646 |
| නොවැම්බර් | 1,478 | 1,617 |
| දෙසැම්බර් | 1,562 | 1,803 |
| එකතුව | 18,191 | 19,430 |

## 3.3 ශ්‍රී ලංගම බස්රථ ඇණිය

ශ්‍රී ලංගමය සතුව 7,000 ක රථ ඇණියක් පැවතියද වර්තමානය වන විට එයින් භාවිතයට ගත හැකි මට්ටමේ පවතින්නේ බස් රථ 5,600 ක පමණ ප්‍රමාණයකි. මෙම රථ ඇණිය තුලද වර්ථමානයේ වයස අවුරුදු 10 වැඩි රථ ප්‍රමාණය ඉහල මට්ටමක දැකිය හැකිය. ඒ අනුව මේවන විට ශ්‍රී ලංගම සතු ධාවනයට සුදුසු බස් රථ ඇණියේ ව්‍යුහය පහත පරිදි වේ.

| ඵලදායී බස්රථ ඇණිය - වයස අනුව (2013. 12. 31 දිනට) | | | | |
|---|---|---|---|---|
| **වයස් කාණ්ඩය** | **බස්රථ සංඛ්‍යාව** | | **මුළු රථඇණිය** | **මුළු රථඇණිය ප්‍රතිශතයක් ලෙස** |
| | **ධාවනය වන** | **ධාවනය නොවන** | | |
| අවුරුදු 02 ට අඩු | 581 | 22 | 603 | 8% |
| අවුරුදු 02ත් - 05ත් අතර | 255 | 26 | 281 | 4% |
| අවුරුදු 05ත් - 10ත් අතර | 1,677 | 337 | 2,014 | 28% |
| අවුරුදු 10ත් - 15ත් අතර | 1,381 | 1,105 | 2,486 | 35% |
| 15ට වැඩි | 912 | 847 | 1,759 | 25% |
| **එකතුව** | **4,806** | **2,337** | **7,143** | |

- 2013 වර්ෂයේදී මහා භාණ්ඩාගාරයේ අරමුදල් මඟින් නව බස්රථ 281 ක් මිළදී ගැනීමට සැලසුම් කර ඇත. 2013 දෙසැම්බර් වන විට මෙම බස්රථ වලින් රථ 261 ක් මිළට ගෙන රථ ඇණියට එකතුකර ඇත. මේ වන විට එම බස්රථ ශ්‍රී ලංගම මෙහෙයුම් කටයුතු සඳහා දායකවෙමින් පවතී. ඒ අනුව 2011 වර්ෂයේ සිට මේ දක්වා රථ ඇණියට එක්කල බස් රථ පිළිබඳ තොරතුරු මෙසේය.

| 2011 වර්ෂයේ සිට රථ ඇණියට එක්කල නව බස් රථ | | | |
|---|---|---|---|
| | 2011 | 2012 | 2013 දෙසැම්බර් |
| මහා භාණ්ඩාගාරයේ අරමුදල් මඟින් රථ ඇණියට එක් කල සාමාන්‍ය බස් රථ | 10 | 120 | 261 |
| කල්බදු ක්‍රමය යටතේ රථ ඇණියට එක්කල සාමාන්‍ය බස් රථ | 162 | 146 | 16 |
| කල්බදු ක්‍රමය යටතේ රථ ඇණියට එක්කල සුඛෝපභෝගි බස් රථ | - | 12 | 24 |
| **එකතුව** | **172** | **278** | **301** |

- ශ්‍රී ලංගම මඟින් වාරික ගෙවීමේ පදනම මත ඇරඹූ ව්‍යාපෘතියට අනුව යමින් 2013 වර්ෂයේදී මිළට ගත් සුඛෝපභෝගී බස්රථ ගණන 17 කි. වර්තමානය වන විට ශ්‍රී ලංගම මෙහෙයුම් කටයුතු සඳහා මෙම බස් යොමුකර ඇත.

- ශ්‍රී ලංගමයට අයත් බස් රථ දීර්ඝ කාලීනව ධාවනයට යොමුකිරීම තුල එම රථ වල එංජින්, ගියර් පෙට්ටි, බස් බොඩි නැවත අළුත් වැඩියා කලයුතු මට්ටමට පත්ව ඇත. 2013 වර්ෂය තුලදී බස් රථ සඳහා සවිකර ඇති නිෂ්පාදිතයන් සහ ධාවනයෙන් ඉවත්ව තිබූ බස්රථ අළුත්වැඩියාව පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| 2013 වර්ෂයේ නිෂ්පාදන ප්‍රමාණයන් | | |
|---|---|---|
| | 2012 වර්ෂය | 2013 දෙසැම්බර් අගවන විට |
| එංජින් | 725 | 820 |
| ගියර් පෙට්ටි | 328 | 377 |
| බස් බොඩි | 208 | 217 |
| ඉන්ධන පොම්ප | 332 | 188 |
| ඉන්ධන විදින | 1,380 | 804 |

- බස්රථ නඩත්තුව සඳහා අවශ්‍ය එන්ජින්, ගියර් පෙට්ටි, බස් බොඩි අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය වන අමතර කොටස් බදු සහන පදනම මත ටෙන්ඩර් මණ්ඩල අනුමත සැපයුම්කරුවන් මගින් අවශ්‍යතා අනුව මිලදී ගෙන සැපයීම සඳහා නිසි ක්‍රමවේදයන් සැකසීම පසුගිය කාල පරිච්ඡේදයේදී සිදුකල අතර මේ වන විට එම ක්‍රියාවලිය තුලින් අමතර කොටස් වියදම යම් මට්ටමකට අඩු කිරීමට පියවර ගෙන ඇත.

- 2012 වර්ෂයේ දිනකට ධාවනයට ලබාදුන් බස්රථ ප්‍රමාණය සාමාන්‍යයෙන් 4,694 ක ප්‍රමාණයක් වන නමුත් 2013 වර්ෂයේ දෙසැම්බර් වන විට එහි සාමාන්‍යය 4,721 මට්ටමක පවත්වාගෙන යාමට සමත් වී ඇත. 2013 අප්‍රේල් මාසයේ සිට ධාවනයට ලබාදී ඇති බස්රථ ප්‍රමාණය සමාන්‍ය මට්ටමට වඩා ඉහලින් පවත්වාගෙන යාමට සමත්වී ඇත. ගනු ලැබූ විවිධ ක්‍රියාමාර්ග තුලින් එම තත්ත්වය සාර්ථක කරගැනීමට හැකිව ඇත.

- 2012 වර්ෂයේ දී දිනකට ධාවනය කල බස්රථ ප්‍රමාණය සාමාන්‍ය වශයෙන් 4,314 ක් වුවද 2013 වර්ෂයේ එම ප්‍රමාණය 4,371 දක්වා වැඩිකර ගැනීමට සමත්ව ඇත.

- 2013 වර්ෂයේ ධාවනය කල සාමාන්‍ය කිලෝමීටර් ප්‍රමාණය මසකට කිලෝමීටර් මිලියන 28 ක් පමණ වන අතර, එම තත්වය ආරක්ෂාකර ගැනීමට පවතින රථඇණිය තුලින් හැකි උපරිම උත්සාහයන් ගනිමින් සිටී.

## 3.4 ශ්‍රී ලංගම මානව සම්පත.

2005 වර්ෂයේ ශ්‍රී ලංගම නැවත ස්ථාපිත කරනු ලැබූ විට ශ්‍රී ලංගම සතුව විශාල සේවක මණ්ඩලයක් පැවති අතර එම සේවක මණ්ඩලය සංඛ්‍යාත්මක වශයෙන් 38,952 කි. මෙය ශ්‍රී ලංගමයට දැරිය නොහැකි තත්වයක් වූ බැවින් නව බඳවා ගැනීම් හැකිතාක් දුරට අඩුකර ඇත. ඒ අනුව පසුගිය වර්ෂවල ශ්‍රී ලංගම සේවක තත්ත්වය පහත පරිදිවේ.

| 2005 සිට සේවක ව්‍යුහය | | | | | | |
|---|---|---|---|---|---|---|
| **වර්ෂය** | **ප්‍රාදේශීය කාර්යාල සහ ඩිපෝවන්** | **ප්‍රාදේශීය වැඩපලවල්** | **රියැදුරු අභ්‍යාස විදුහල්** | **මධ්‍යම බස් රථ කාර්යාලය** | **ශ්‍රීලංගම ප්‍රධාන කාර්යාලය** | **එකතුව** |
| 2005.10.19 | වෙන් වෙන් වශයෙන් සංඛ්‍යා ලේඛන නොමැත | | | | | 38,952 |
| 2006.12.31 | 35,252 | 1,121 | 55 | 370 | 834 | 37,632 |
| 2007.12.31 | 34,986 | 964 | 72 | 301 | 826 | 37,149 |
| 2008.12.31 | 33,821 | 917 | 80 | 284 | 1,028 | 36,130 |
| 2009.12.31 | 33,134 | 827 | 85 | 286 | 1,033 | 35,365 |
| 2010.12.31 | 32,601 | 782 | 84 | 263 | 1,042 | 34,772 |
| 2011.12.31 | 32,135 | 775 | 58 | 268 | 1,027 | 34,263 |
| 2012.12.31 | 31,761 | 757 | 57 | 273 | 958 | 33,806 |
| 2013.12.31 | 30,590 | 722 | 57 | 288 | 973 | 32,630 |

- 2013 ජනවාරි සිට දෙසැම්බර් දක්වා බඳවාගෙන ඇති මුළු සේවක සංඛ්‍යාව 1905 කි. එයින් 44% ක ප්‍රමාණයක් රියදුරු හා 46% ක ප්‍රමාණයක් කොන්දොස්තර බඳවා ගැනීම් වේ. ඒ අනුව මුළු බඳවා ගැනීම් වලින් 90% ක් පමණ සේවාව නිසි පරිදි පවත්වාගෙන යාමට අවශ්‍ය රියදුරු හා කොන්දොස්තර බඳවා ගැනීමය.

- මෙම සේවා මණ්ඩලය මේ අයුරින්ම පවත්වාගෙන නොගොස් මෙම ශ්‍රමය හැකිතරම් ඵලදායීව ප්‍රයෝජනයට ගැනීමේ අරමුණ ඇතිව විවිධ පුහුණු වැඩ සටහන් ක්‍රියාවට නංවා ඇත. ඒ අනුව 2013 වර්ෂයේ දෙසැම්බර් මස අවසන් වන විට පවත්වන මුළු පුහුණු වැඩසටහන් ගණන 15කි. එමගින් වඩා වැදගත් අංශවල සිටින සේවකයින් පුහුණුවට ලක්කර ඇත. එසේ පැවත්වූ පුහුණු වැඩසටහන් පහත පරිදි වේ.

  - ➢ ආරක්ෂාකාරීව හා පිරිවැය අවම වන අයුරින් රියදුරු මහතුන් පුහුණු කිරීම සඳහා වැඩමුළුවක් පැවැත්වීම.
  - ➢ ජ්‍යෙෂ්ඨ ඩිපෝ පරීක්ෂක ධාවන මහතුන් මඟින් ඩිපෝවල රියදුරු, කොන්දොස්තර මහතුන් පුහුණු කිරීම සඳහා වැඩමුළුවක් පැවැත්වීම.
  - ➢ විනය කටයුතු නිලධාරී මහතුන් පුහුණු කිරීම සඳහා වැඩමුළුවක් පැවැත්වීම.
  - ➢ කාර්ය සාධන ඇගයීම් මත විගණන කටයුතු කිරීමේ පුහුණු වැඩමුළුවක් පැවැත්වීම.
  - ➢ යහපත් වැඩ පරිසරය ඇතිකිරීමේ පුහුණු වැඩමුළුවක් පැවැත්වීම.
  - ➢ HRIS දත්ත ඇතුලත් කිරීමේ පුහුණු වැඩමුළුවක් පැවැත්වීම.
  - ➢ ඵලදායිතා වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ වැඩමුළුවක් පැවැත්වීම.
  - ➢ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩමුළුවක් පැවැත්වීම.
  - ➢ ඉන්ධන පොම්ප, වාහන විදුලි සහ යාන්ත්‍රික ශිල්පී කාර්මිකයින් පිටස්තර ප්‍රායෝගික පුහුණු වලට යෙදවීම. (ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය)

- පසුගිය මාස කිහිපය තුල ශ්‍රී ලංගම සේවක ප්‍රමාණය 33,856 ත් 33,181 ත් අතර පරාසයේ තබාගනිමින් කටයුතු කිරීමට අපට හැකිව ඇත.

- ශ්‍රී ලංගම ප්‍රධාන ගැටළුවක්ව පවතින පාරිතෝෂික ගෙවීම් මේවන විට හැකි උපරිම අයුරින් ගෙවීම් කරමින් එම ගැටළුව නිරාකරණය කරගැනීමට කටයුතු කරමින් සිටී. මේවන විට පහත පරිදි එහි මුදල් ගෙවීම් සිදුකරමින් ඇත.

| **ශ්‍රී ලංගමයේ පාරිතෝෂික ගෙවීම්** | | | |
|---|---|---|---|
| | **විස්තරය** | **සේවකයින්** | **රු.මිලියන** |
| 1 | 2012 මැයි 1 දින ගෙවීම් | 230 | 122 |
| 2 | 2012 මැයි 1 දිනට පසු ගෙවීම් | 204 | 108 |
| 3 | අධිකරණ නඩු 2855 ගෙවීම් | 2,855 | 748 |
| 4 | 2013 අප්‍රේල් 11 ගෙවීම් | 175 | 81 |
| 5 | පැමිණිලි සඳහා ශ්‍රී ලංගම අනුමැතිය ලබාදුන් සංඛ්‍යාව | 4,560 | 2,091 |
| | **උපකල්පිත විස්තර** | | |
| 6 | පැමිණිලි නොකල සංඛ්‍යාව පිළිබඳ ඇස්තමේන්තුව | 3,125 | 1,150 |
| | **එකතුව** | **9,914** | **3,716** |

2005.10.19 දිනෙන් පසු විශ්‍රාම ලැබූ සේවකයින්ට මෙම පාරිතෝෂික ගෙවීම් සඳහා රු.මිලියන 3,716 ක් පමණ වැයවේ යැයි ගණන් බලා ඇත.

## 3.5 ශ්‍රී ලංගම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

මේවන විට ශ්‍රී ලංගම සතුව පවතින ගොඩනැගිලි අළුත්වැඩියා කලයුතු මට්ටමකට පැමිණ ඇත. නමුත් පවතින මූල්‍ය දුෂ්කරතා මග හරවා ගනිමින් මෙම කටයුතු සිදුකල යුතු බැවින් ඇතිවන අවශ්‍යතාවය පරිදි ප්‍රධාන කාර්යාලය හා අනිකුත් කාර්යාලවල යටිතල පහසුකම් වර්ධනය කිරීමට පියවර ගනිමින් සිටී. ඒ අනුව පසුගිය කාලපරිච්ඡේදය තුල පහත නඩත්තු කටයුතු සිදුකරමින් පවතී.

- ➢ ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයේ, ශාලිකා ගොඩනැගිල්ලේ සහ ශ්‍රී ලංගම සතු වෙනත් සේවා සපයන ස්ථාන වල නඩත්තු හා අළුත්වැඩියා කටයුතු සිදු කිරීම.
- ➢ ප්‍රාදේශීය කාර්යාල වල, ප්‍රාදේශීය වැඩපළ වල සහ ඩිපෝ වල ඇති ආරක්ෂක වැටවල් සහ මායිම් තාප්ප නඩත්තු කටයුතු හා අළුත්වැඩියා කිරීම.
- ➢ දෙවන අදියර යටතේ කතරගම විශ්‍රාම ශාලාව නවීකරණ කටයුතු සිදු කිරීම, දැනට මෙහි කටයුතු සිදුවෙමින් පවතී.
- ➢ සංචාරක බංගලා හා විශ්‍රාමශාලාවල අළුත්වැඩියා කටයුතු සිදුකරමින් පවතින අතර ආරම්භය ලෙස අනුරාධපුර සංචාරක නිවාසය නවීකරණය කර ඇත.

- දැයට කිරුළ ප්‍රදර්ශනයට සමගාමීව යමින් අම්පාර ඩිපෝව නවිකරණය කිරීම සිදු කල අතර, මෙම වර්ෂයේ දැයට කිරුළ ශ්‍රී ලංගම ප්‍රදර්ශන කුටිය ඉතා සාර්ථකව පවත්වාගෙන යමින් ශ්‍රී ලංගම නාමය තව දුරටත් ජනතාව අතරට යැවීමට කටයුතු කර ඇත.

- සේවක වැටුප් සෑදීමේදී මෘදුකාංගය ක්‍රියාත්මක කිරීම සිදුවෙමින් පවතී. මේ වන විට උඩහමුල්ල හා රත්මලාන යන ඩිපෝවන්හි වැටුප් සෑදීම මෙම මෘදුකාංගය භාවිතයෙන් සිදු කරනු ලබයි. අනෙකුත් ඩිපෝවන් සඳහා පුහුණු වැඩසටහන් සිදු කරමින් පවතී.

- තොග පාලනය හා කළමනාකරණ මෘදුකාංගය මේ වන විට ප්‍රධාන කාර්යාලය හා කළුතර ප්‍රාදේශීකය මඟින් භාවිතා කරනු ලබන අතර මහනුවර, රජරට, නුවරඑළිය යන ප්‍රාදේශීය කාර්යාලයන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මකවේ.

- ඉන්ධන පිරවුම්හල් ස්ථාපිත කිරීමේ වැඩසටහන යටතේ දැනට රත්මලාන ඉන්ධන පිරවුම්හල නැවත ස්ථාපිතකර ඇති අතර කොග්ගල ඉන්ධන පිරවුම්හල ඉදිකිරීම සඳහා කටයුතු සිදුකරමින් පවතී.

- ශ්‍රී ලංගම සතු බස්නැවතුම්පල වල නඩත්තු කටයුතු සිදුකිරීමට සමගාමීව වයඹ ප්‍රාදේශීය තුල මහව බස් නැවතුම්පලේ අළුත්වැඩියා කටයුතු ආරම්භ කර ඇත.

- මුලතිව් ඩිපෝව නැවත ඉදිකිරීම හා නවීකරණය.

- රියදුරු පාසල් වැඩිදියුණුකර ආදායම් උපයා ගැනීම ඉලක්කකර රියදුරු පාසැල් නවීකරණය කිරීම යටතේ ආරම්භය ලෙස අඟුලාන රියදුරු පුහුණු පාසල නවීකරණය කිරීම හා නේවාසිකාගාරය ඉදිකිරීම.

# 4. ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය

## 4.1 හැඳින්වීම

1997 අංක 25 දරණ ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනත මඟින් ස්ථාපිත කර ඇත. ආයතනයේ මූලික අරමුණු ඉටුකර ගැනීම උදෙසාත්, ප්‍රධාන කාර්යාලය හා ශාඛා කාර්යාල විස්සක් (20) දිවයින පුරා ස්ථාපිත කර ඇත.

ශ්‍රී ලංකාව තුළ සිටින බරවාහන මෙන්ම සැහැල්ලු වාහන රියදුරන්ගේ සෞඛ්‍යමය තත්ත්වය පිළිබඳව උසස් හා ගුණාත්මක වෛද්‍ය පරීක්ෂණයක් සිදුකර, ඒ අනුව වෛද්‍ය සහතික නිකුත් කිරීම සඳහා ප්‍රධාන කාර්යාලය හා ශාඛා කාර්යාල මඟින් අවශ්‍ය සේවා සම්පාදනය කරනු ලැබේ.

**දැක්ම**

සෑම සුක්කානමක් පිටුපසම නිරෝගිමත් රියදුරකු හිඳුවීම

**මෙහෙවර**

ශ්‍රී ලංකාව තුළ ප්‍රවාහන වෛද්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වෙමින් සියළුම රියදුරු බලපත්‍ර අපේක්ෂකයන්ට අධ්‍යාත්මික හා ගුණාත්මක වෛද්‍ය පරීක්ෂණ සිදුකර ශාරීරික හා මානසික යෝග්‍යතාවය පිළිබඳ සහතික කිරීම.

## 4.2 පරමාර්ථ

i. සියළුම රියදුරු බලපත්‍ර අයදුම්කරුවන්ගේ ශාරීරික සහ මානසික යෝග්‍යතාවය පරීක්ෂා කර බැලීම.

ii. නිකුත් කරනු ලබන වෛද්‍ය සහතිකයේ ගුණාත්මක බව හා ආරක්ෂක උපක්‍රම වර්ධනය කිරීම.

iii. මනා මානව සම්පත් කළමනාකරණය තුළින් සේවාවේ ගුණාත්මක බව ළඟා කරගැනීම.

## 4.3 ආයතනයේ කාර්යයන්

1997 අංක 25 දරණ ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනත යටතේ ස්ථාපිත ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ කර්තව්‍යයන් පහත දැක්වේ.

(අ) බරවාහන ඇතුළු සියළු වර්ගවල මෝටර් වාහන පදවන හෝ ධාවනය කරන රියදුරන්ට සහ ධාවකයන්ට වෛද්‍ය සේවා සැලසීම.

(ආ) බරවාහන ඇතුළු සියළු වර්ගවල මෝටර් වාහනවල රියදුරන් හා ධාවකයන් පරීක්ෂා කර ඒ රියදුරන්ට හා ධාවකයන්ට ශාරීරික හා මානසික යෝග්‍යතාව පිළිබඳ සහතික ලබාදීම.

(ඇ) බරවාහන ඇතුළු සියළු වර්ගවල වාහනවල රියදුරන් හා ධාවකයන් වෛද්‍ය පරීක්ෂණවලට භාජනය කර ඔවුන්ගේ සුදුසුකම සහ යෝග්‍යතාව පිළිබඳ නිර්දේශ ලබාදීම.

(ඈ) කවර හෝ වර්ගයක මෝටර් වාහනවලට අදාළ අනතුරු හා සම්බන්ධ අවස්ථාවලදී වෛද්‍ය සේවා සැලසීම.

(ඉ) සියළු වාර්තාවලට අයත් මෝටර් වාහන, ශාරීරිකව හා මානසික යෝග්‍ය හා ප්‍රවීණ තැනැත්තන් විසින් පමණක් ධාවනය කරනු ලබන හෝ පදවනු ලබන බවට, ආයතනය විසින්ම හෝ වෙනත් නියෝජිතායතන විමසා හෝ කටයුතු කිරීමට වගබලා ගැනීම.

(ඊ) ආයතනයේ කර්තව්‍යය ඉටුකිරීමේ කාර්යය සඳහා විවිධ දිස්ත්‍රික්කවල හා පළාත්වලට සුදුසු වෛද්‍ය නිලධරයන්ගේ මණ්ඩලයක් පත්කිරීම.

(උ) කාර්මික ස්වස්ථතාව සහ කාර්මික අනතුරු පිළිබඳව වෛද්‍ය උපදෙස් හා නිර්දේශ ලබාදීම.

(ඌ) අදාළ ක්‍රියාත්මක කිරීමේ බලධරයන් විසින් පිළිගත යුතු හා ක්‍රියාත්මක කළ යුතු ප්‍රවාහන වෛද්‍ය කටයුතුවලට ප්‍රමිති සකස් කිරීම හා සීමා නියම කිරීම.

## 4.4 වර්තමාන කාර්ය සාධනය

- 2013 වර්ෂයේ මේ දක්වා ප්‍රධාන විධායක නිලධරයා ලෙස සභාපතිවරු දෙදෙනෙකු කටයුතු කළ අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ මඟපෙන්වීම මත 2013 වර්ෂය තුල මෙම ආයතනයේ ප්‍රධාන කාර්යයන් වන රියදුරු බලපත්‍ර අපේක්ෂකයින්ගේ වෛද්‍ය පරීක්ෂණ සිදුකොට වෛද්‍ය සහතික නිකුත් කිරීම පිළිබඳ විග්‍රහයක් පහත දක්වා ඇත.

**2013.12.31 දින දක්වා**

| වෛද්‍ය පරීක්ෂණ සිදුකළ කණ්ඩායම | සිදුකරන ලද මුළු වෛද්‍ය පරීක්ෂණ සංඛ්‍යාව | සෞඛ්‍යමය හේතුන් මත වෛද්‍ය පරීක්ෂණය අසමත් වූ රියදුරන් හා රියදුරු බලපත්‍ර අපේක්ෂකයින් සංඛ්‍යාව | අසමත් වූ රියදුරන් හා රියදුරු බලපත් අපේක්ෂකයින්ගේ ප්‍රතිශතය |
|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | 73850 | 3625 | 4.91% |
| මහනුවර | 25180 | 3193 | 12.68% |
| ගාල්ල | 15397 | 2611 | 16.96% |
| කුරුණෑගල | 35074 | 2319 | 6.61% |
| අනුරාධපුර | 17447 | 2699 | 15.47% |
| හම්බන්තොට | 13778 | 578 | 4.20% |
| රත්නපුර | 14465 | 360 | 2.49% |
| බදුල්ල | 10873 | 664 | 6.11% |
| මොණරාගල | 7685 | 538 | 7.00% |
| අම්පාර | 10582 | 423 | 4.00% |
| මඩකලපුව | 11864 | 619 | 5.22% |
| වේරහැර | 40818 | 4986 | 12.22% |
| මාතර | 11468 | 1664 | 14.51% |
| වවුනියාව | 6545 | 277 | 4.23% |
| මන්නාරම | 2107 | 32 | 1.52% |
| ත්‍රිකුණාමලය | 7932 | 42 | 0.53% |
| කිලිනොච්චිය | 4215 | 77 | 1.83% |
| යාපනය | 10800 | 564 | 5.22% |
| ගම්පහ | 36588 | 3654 | 9.99% |
| කළුතර | 13917 | 528 | 3.79% |
| මාතලේ | 1211 | 140 | 11.56% |
| | 371796 | 29593 | 7.96% |

සැ.යු. ඉහත මුළු වෛද්‍ය පරීක්ෂණ සඳහා බරවාහන, සැහැල්ලු වාහන හා මාර්ග බලපත්‍ර සඳහා සිදුකරනු ලබන වෛද්‍ය පරීක්ෂණ පමණක් සැලකිල්ලට ගෙන ඇත.

- එනම් පරීක්ෂණ සඳහා ඉදිරිපත් වූ අපේක්ෂකයන්ගෙන් සෑම 100 දෙනෙකුටම 7 - 9 ත් අතර සංඛ්‍යාවක් සෞඛ්‍යමය හේතූන් මත රිය පැදවීමට නුසුදුසු බවට තහවුරු වී ඇත.

- මෝටර් රථ ප්‍රවාහන පනතේ සංශෝධනයත් සමඟ බරවාහන රියදුරු බලපත්‍ර වලංගු කාලය අවුරුදු 3 සිට අවුරුදු 4 දක්වා දීර්ඝ කරන ලදි. එසේම, බරවාහන බලපත්‍ර අළුතින් ලබාගැනීම සඳහා සැහැල්ලු වාහන බලපත්‍ර ලබාගෙන අවුරුදු 2 ක කාලයක් සම්පූර්ණ වන තුරු අයදුම් කිරීමේ හැකියාවක් නොමැත. ඒ හේතුවෙන් අප ආයතනය වෙත වෛද්‍ය පරීක්ෂණ සඳහා යොමුවන සංඛ්‍යාව පෙර වර්ෂවලට සාපේක්ෂව පළමු කාර්තුවේ අඩුවීමක් දක්නට ලැබිණි.

සැහැල්ලු වාහන සඳහා භාවිතා කරන ලද MT31A පෝරමය වෙනුවට අප ආයතනයේ මුද්‍රිත ආරක්ෂිත උපක්‍රම සහිත සැහැල්ලු වාහන වෛද්‍ය පෝරමය භාවිතයට ගැනීමටත් කෑගල්ල, පොළොන්නරුව, පුත්තලම, මුලතිව්, නුවරඑළිය, මාතලේ යන දිස්ත්‍රික්ක හැර අනෙකුත් සියළුම දිස්ත්‍රික්කවල අප ආයතනයෙන් පමණක් වෛද්‍ය වාර්තා නිකුත් කිරීමටත් 2013.03.21 දින සිට තීරණය විය. ඒ අනුව, ප්‍රධාන කාර්යාලය ඇතුළු සියළුම ශාඛාවන් සඳහා සේවය ලබාගැනීමට පැමිණෙන සේවාලාභීන් සංඛ්‍යාව දෛනිකව වැඩි වී ඇත.

| 2013 | සැහැල්ලු වාහන වෛද්‍ය පරීක්ෂණ සංඛ්‍යාව |
|---|---|
| ජනවාරි | 2908 |
| පෙබරවාරි | 2556 |
| මාර්තු | 3089 |
| අප්‍රේල් | 13285 |
| මැයි | 19196 |
| ජුනි | 23304 |
| ජුලි | 29507 |
| අගෝස්තු | 31215 |
| සැප්තැම්බර් | 35902 |
| ඔක්තෝම්බර් | 34189 |
| නොවැම්බර් | 29313 |
| දෙසැම්බර් | 31468 |

- ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන වෙත පොලිස් දෙපාර්තමේන්තුවෙන් හා අධිකරණය මඟින් යොමුකරන ලද සේවාලාභීන්ගේ ප්‍රතිශතය අනුව 7% - 9% අතර ප්‍රතිශතයක් රිය පැදවීම සඳහා සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත නොවන බවට හඳුනා ගෙන ඇත. ඒ අනුව, සෞඛ්‍යමය වශයෙන් නුසුදුසු රියදුරන් රිය ධාවනය නොකිරීම සහතික කිරීම සඳහා අප විසින් ක්‍රියාකිරීම මගින් මාර්ග අනතුරු අවම කිරීමට දායක වී ඇත.

| මාසය | පොලිස් දෙපාර්තමේන්තුවෙන් හා අධිකරණයෙන් වෛද්‍ය පරීක්ෂණය සඳහා යොමුකරන සංඛ්‍යාව | අසමත් සංඛ්‍යාව | අසමත් සේවාලාභීන්ගේ ප්‍රතිශතය |
|---|---|---|---|
| ජනවාරි | 186 | 10 | 5.37% |
| පෙබරවාරි | 167 | 15 | 8.98% |
| මාර්තු | 172 | 17 | 9.88% |
| අප්‍රේල් | 196 | 13 | 6.63% |
| මැයි | 237 | 21 | 8.86% |
| ජුනි | 227 | 17 | 7.48% |
| ජුලි | 266 | 21 | 7.89% |
| අගෝස්තු | 202 | 16 | 7.92% |
| සැප්තැම්බර් | 237 | 12 | 5.06% |
| ඔක්තෝම්බර් | 215 | 21 | 9.77% |
| නොවැම්බර් | 216 | 14 | 6.48% |
| දෙසැම්බර් | 167 | 12 | 7.19% |
| **එකතුව** | **2494** | **199** | **7.98%** |

- ව්‍යාජ පුද්ගලයින් වෛද්‍ය පරීක්ෂණයට පෙනී සිටීම වැළැක්වීමේ අරමුණින් වෛද්‍ය වාර්තාව සඳහා ඡායාරූපයක් ඇතුළත් කර ගැනීම 2009 වර්ෂයේ සිට කටයුතු කර තිබූ බැවින් එම කටයුතු විධිමත්ව පවත්වා ගැනීම සඳහා ඡායාරූපාගාරයක් ආයතනය තුළ ස්ථාපිත කළ අතර, තවදුරටත් වෛද්‍ය පරීක්ෂණයට ව්‍යාජ පුද්ගලයින් පෙනී සිටීම අවම කිරීම සඳහා වෛද්‍ය වාර්තාව සඳහා ඡායාරූපය ආයතනය තුළ ස්ථාපිත ඡායාරූපාගාරයෙන් ගැනීම අනිවාර්ය කිරීමත් ශාඛා කාර්යාලවලද ඡායාරූපාගාර පිහිටුවීමට කටයුතු කර ඇත. එමගින් සේවාලාභියාට පහසු හා ඉක්මන් සේවාවක් ලබාදීමට හා ආයතනයේ ආදායම් වර්ධනය කර ගැනීමටත් හැකි වී ඇත. මේ වන විට පහත ශාඛා කාර්යාලවල ඡායාරූපාගාර ස්ථාපිත කර ඇත.

| ශාඛා කාර්යාලය | ආරම්භ කළ දිනය |
|---|---|
| කුරුණෑගල | 2012.02.22 |
| හම්බන්තොට | 2012.06.18 |
| රත්නපුර | 2012.06.19 |
| මහනුවර | 2012.07.02 |
| ගම්පහ | 2012.09.22 |
| අනුරාධපුර | 2012.11.17 |
| වේරහැර | 2013.01.16 |
| ගාල්ල | 2013.01.19 |
| බදුල්ල | 2013.02.18 |
| මාතර | 2013.04.29 |

- මාතලේ දිස්ත්‍රික්කයේ සේවාලාභීන්ට කඩිනම් හා කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා 2013.11.22 දින මාතලේ ශාඛා කාර්යාලය ආරම්භ කරන ලදී.

- සේවාලාභීන්ට කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා වේරහැර වාහන ගම්මානය තුළ පිහිටි කාර්යාලයේ කටයුතු පෙ.ව. 7.30 ට ආරම්භ කිරීමටත්, ගම්පහ ශාඛාව පෙ.ව. 7.00 ට ආරම්භ කිරීමටත්, කුරුණෑගල ශාඛාව පෙ.ව. 8.00 ට ආරම්භ කිරීමටත් කටයුතු කර ඇත. තවද, වේරහැර ශාඛාව වැඩි සේවාලාභීන් සංඛ්‍යාවකට සේවාව සැපයීමේ අරමුණින් එහි දැනට ලබා දී ඇති ඉඩ ප්‍රමාණය වැඩි කර ගැනීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇති අතර, වේරහැර ශාඛාව පවත්නා ගොඩනැගිල්ල රු. මිලියන 5.05 ක් වියදම් කර වැඩිදියුණු කිරීම සිදුකරන ලදී.

- ප්‍රාදේශීය කාර්යාල බොහොමයක් රජයේ ගොඩනැගිලිවල ස්ථාපිත කිරීමට කටයුතු කර ඇත. අනුරාධපුර ශාඛාව රජයේ ගොඩනැගිල්ලකද, අම්පාර ශාඛාව විවිධ සේවා සමූපකාර ගොඩනැගිල්ලකද, වේරහැර ශාඛාව වේරහැර ගම්මානයේ ගොඩනැගිල්ලකද, හම්බන්තොට, වවුනියාව, මන්නාරම, ත්‍රිකුණාමලය, කිලිනොච්චිය හා කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිලිවල ස්ථාපිත කර ඇත. අනෙකුත් ශාඛා කාර්යාල පෞද්ගලික අයගෙන් කුලියට ගන්නා ලද ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලැබේ. ඒ සඳහාද රජයේ ගොඩනැගිලි ලබාගැනීම සඳහා ඉල්ලීම් කර ඇත. තවද, මහනුවර ශාඛාව සඳහා ආයතනය වෙත ලැබී ඇති ඉඩමේ ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කටයුතු 2014 වසර තුළ ඇරඹීමට නියමිතය.

- 2013 ''දැයට කිරුළ'' ජාතික සංවර්ධන ප්‍රදර්ශනයේදී අම්පාර හා මඩකලපුව දිස්ත්‍රික් ප්‍රධානව නැගෙනහිර පළාතේ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- ආයතනයේ සේවාවල ගුණාත්මක භාවය වැඩිකිරීම සඳහා SLIDA මඟින් පවත්වනු ලබන පශ්චාත් ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අප ආයතනයේ වෛද්‍ය නිලධාරී මහත්මියක් සහභාගී කරවීම / එක් දින වැඩමුළු හා පුහුණු වැඩසටහන් සඳහා සේවක මහත්ම මහත්මීන් යොමු කිරීම.

- ආයතනයේ සේවකයන්ගේ අභිප්‍රේරණය ඉහළ නැංවීමට විවිධ සුභසාධන වැඩසටහන් ක්‍රියාවට නැංවීම.

- ආයතනයේ පවතින ඉඩ පහසුකම් උපරිම ප්‍රයෝජනයට ගනිමින් සේවාදායකයින්ට වාහන නැවතීමේ පහසුකම් සැලසීමද පෞද්ගලික ආයතනයක ඉල්ලීම මත වාහන නවතා තැබීමේ ඉඩ පහසුකම් සැලසීමද පෙර වර්ෂයේ මෙන්ම සිදුකරනු ලබයි. එමගින් ආයතනයේ අමතර ආදායම් වර්ධනය කිරීමට කටයුතු කර ඇත.

- වඩා ගුණාත්මක භාවයෙන් යුතු අංග සම්පූර්ණ එක්ස්-රේ වාර්තාවක් සේවාලාභීන්ට ලබාදීම සඳහා රු. ලක්ෂ 59 ක් වැය කර RADSPEED - M UD 150 L - 40 E දරණ නවීන එක්ස්-රේ යන්ත්‍රයක් ආයතනයේ සවිකිරීමට කටයුතු කර ඇත.

## 4.5 ආයතනයේ ආදායම් වියදම් තත්ත්වය.

| කාර්යාල | ආදායම (රු.) | වියදම (රු.) | අතිරික්තය / හිඟය (රු.) |
|---|---|---|---|
| නුගේගොඩ හා වේරහැර | 114,763,691.81 | 111,865,973.85 | 2,897,717.96 |
| මහනුවර | 27,813,637.87 | 13,578,626.26 | 14,235,011.61 |
| ගාල්ල | 13,474,035.51 | 8,198,498.72 | 5,288,459.79 |
| කුරුණෑගල | 32,549,857.12 | 10,754,918.05 | 21,794,939.07 |
| අනුරාධපුර | 16,237,581.82 | 6,177,970.11 | 10,059,611.71 |
| හම්බන්තොට | 11,515,642.25 | 6,139,890.18 | 5,375,752.07 |
| රත්නපුර | 12,891,963.02 | 5,949,569.89 | 69,423,393.13 |
| බදුල්ල | 9,530,777.81 | 5,893,182.18 | 3,637,595.63 |
| මොණරාගල | 5,055,015.84 | 3,294,173.73 | 1,760,842.11 |
| මඩකලපුව | 8,079,429.49 | 3,827,251.59 | 4,252,177.90 |
| අම්පාර | 6,927,077.55 | 4,826,522.23 | 2,100,555.32 |
| වවුනියාව / කිලිනොච්චිය | 7,920,260.10 | 5,479,470.73 | 2,440,789.37 |
| මන්නාරම | 1,267,900.00 | 1,865,541.00 | 597,641.00 |
| මාතර | 10,030,326.82 | 6,234,194.80 | 3,796,132.02 |
| ත්‍රිකුණාමලය | 5,513,513.19 | 3,019,726.47 | 2,493,786.72 |
| යාපනය | 6,904,290.31 | 4,113,968.10 | 2,790,322.21 |
| ගම්පහ | 28,972,433.82 | 10,327,507.39 | 18,644,926.43 |
| කළුතර | 8,765,575.00 | 4,968,125.15 | 3,797,449.85 |
| මාතලේ | 749,487.96 | 966,178.11 | 2,416,690.15 |
| **එකතුව** | **328,962,497.29** | **217,481,288.54** | **111,481,208.75** |

# 5. සීමාසහිත ලක්දිව ඉංජිනේරු පුද්ගලික සමාගම

## 5.1 හැඳින්වීම

මෙම ආයතනයේ මුලික පරමාර්ථය ලංගම බස්රථ අඩු වියදමකින් උසස් ප්‍රමිතියක් යටතේ අලුත්වැඩියා කොට පොදු ජන සේවයට එකතු කිරීමය.

**දැක්ම**

''ශ්‍රී ලංකා වාසී ජනතාවට හොඳ ආකර්ශණීය ප්‍රවාහන සේවයක් සඳහා දායක වීම''

**මෙහෙවර**

''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ හා පෞද්ගලික බස් හිමියන්ගේ අබලන් වන මගී බස්රථ සහනදායී මිලකට උසස් තත්වයෙන් අලුත්වැඩියා කර ධාවනයට එක් කිරීමයි.''

## 5.2 2013 වර්ෂයේ ආයතනය ලබා ඇති ප්‍රගතිය (භෞතික හා මුලය)

| මාසය | බස්රථ ප්‍රමාණය | ලංගම වෙතින් ලැබුණ මුදල රු. මි. | නිෂ්පාදන සඳහා වියදම රු. මි. | ආයතනයට ලැබුන ලාභය රු.මි. |
|---|---|---|---|---|
| ජනවාරි | - | - | - | - |
| පෙබරවාරි | 02 | 0.40 | 0.31 | 0.09 |
| මාර්තු | 06 | 3.715 | 3.032 | 0.683 |
| අප්‍රේල් | 04 | 1.642 | 1.324 | 0.318 |
| මැයි | 06 | 2.824 | 2.287 | 0.537 |
| ජුනි | 08 | 3.995 | 3.242 | 0.753 |
| ජූලි | 04 | 1.637 | 1.324 | 0.313 |
| අගෝස්තු | 05 | 3.532 | 2.883 | 0.649 |
| සැප්තැම්බර් | 04 | 1.708 | 1.405 | 0.303 |
| ඔක්තෝම්බර් | 02 | 1.533 | 1.246 | 0.287 |
| නොවැම්බර් | 07 | 4.040 | 3.286 | 0.754 |
| දෙසැම්බර් | 04 | 2.114 | 1.713 | 0.400 |
| **එකතුව** | **52** | **27.140** | **22.052** | **5.087** |

## 5.3 යටිතල පහසුකම්

අක්කර විසි හතරක් වු ලක්දිව ඉංජිනේරු සමාගම් භූමි ප්‍රමාණය තුල විහිදී ගිය කම්හල් ගොඩනැගිලි රාශියකි. ලංකා ගමනා ගමන මණ්ඩලයට පසුගිය කාලයේදී සියලුම අලූත්වැඩියාවන් (එන්ජින් හැර) සිදු කරන ලද්දේ මෙම කම්හල් භූමිය තුලය.

## 5.4 ඵලදායීතා වැඩ සටහන්

සියලුම සේවකයින් සඳහා ප්‍රවාහන පහසුකම් සපයමින් නියමිත වේලාවට සේවකයින් ආයතනයට රැගෙන ඒම සදහා බස්රථ 02 ක් යොදා ගැනේ.